# දෙවැනි කොටස


| | | |
|---|---|---|
| | | පිටුව |
| මහ බැංකුවේ ගිණුම් හා කටයුතු | ... | I—XXIX |
| කාර්ය මණ්ඩල පුවත් | ... | XXXI—XXXIII |

# මහ බැංකුවේ ගිණුම් හා කටයුතු


| | පිටුව |
|---|---|
| ගිණුම් හා බැංකු කටයුතු ... ... ... | I |
| ව්‍යවහාර මුදල් නිකුතුව ... ... ... | VII |
| බැංකු සංවර්ධන ... ... ... | VII |
| බැංකු පරිපාලන ... ... ... | VII |
| සංවර්ධන මුදල් ... ... ... | VIII |
| ග්‍රාමීය ණය ... ... ... | XII |
| ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය ... ... | XVI |
| සේවක අර්ථසාධක අරමුදල් ... ... | XVI |
| විනිමය පාලන ... ... ... | XVIII |
| රාජ්‍ය ණය ... ... ... | XX |
| ප්‍රාදේශීය කාර්යාලය — මාතර ... ... | XX |
| ප්‍රාදේශීය කාර්යාලය — අනුරාධපුරය ... | XXIV |
| අනුග්‍රාහක සේවා ... ... ... | XXVIII |
| ප්‍රකාශන ... ... ... | XXVIII |
| සම්මන්ත්‍රණ ... ... ... | XXIX |
| සමීක්ෂණ ... ... ... | XXIX |
| පුහුණු කිරීම් ... ... ... | XXIX |

# මහ බැංකුවේ ගිණුම් හා කටයුතු

## ගිණුම් හා බැංකු කටයුතු

1984 දෙසැම්බර් 31 වැනි දිනට මහ බැංකුවේ ශේෂ පත්‍රය හා 1984 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලාභාලාභ ගිණුම 2.1 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

පෙර වර්ෂයේ මට්ටමට වඩා සුළු වැඩිවීමක් පෙන්නුම් කරමින්, 1984 අවසානයේදී මහ බැංකුවේ මුළු වත්කම්/වගකීම් ප්‍රමාණය රුපියල් 3,327 කෝටි 18 ලක්ෂයක්ව පැවතුණි. ' ජාත්‍යන්තර සංචිත ' තියුණු ලෙස සියයට 73 කින් වැඩි වූ අතර, 'දේශීය වත්කම් සහ අනෙකුත් වත්කම් හා ගිණුම්' පිළිවෙලින් සියයට 21 කින් සහ සියයට 11 කින් අඩු විය. 'සංසරණයේ පවත්නා මුදල්' වශයෙන් ගැණෙන බැංකුවේ වගකීම් සියයට 17.5 කින් ද, 'තැන්පතු' සියයට 3.7 කින් ද වැඩි විය. ' එතෙර ණය ගැනීම් ' රුපියල් 187 කෝටි 31 ලක්ෂයේ සිට එක්කෝටි 27 ලක්ෂය දක්වා කැපී පෙනෙන අන්දමින් පහත වැටුණි. 1984 ජූනි මාසයේ විවෘත කරන ලද ' මහ බැංකු සුරැකුම්පත් ' ගිණුමෙහි රුපියල් 55 කෝටි 73 ලක්ෂයක ශේෂයක් විය.

1984 වර්ෂයේ බැංකුවේ ආදායම වූ රුපියල් 316 කෝටි 17 ලක්ෂය, ඉකුත් වර්ෂයට වඩා සියයට 7 ක වැඩිවීමක් දක්වීය. වියදම් හා සංචිත ගිණුම් සඳහා වන වෙන් කිරීම් සහ ක්ෂයවීම් සඳහා වෙන් කිරීම් කළ පසු මහ බැංකුවේ ශුද්ධ ලාභය රුපියල් 150 කෝටි 15 ලක්ෂයක් විය. මුදල් නීති පණතේ 39 (ආ) වගන්තිය ප්‍රකාර රුපියල් 10 ලක්ෂයක් බැංකුවේ අතිරික්තයට එක් කරන ලදී. මහ බැංකුවට, ආණ්ඩුව නොපියවා ඇති ණය කොටසක් ඇවර කරනු පිණිස ශේෂ වූ රුපියල් 150 කෝටි 5 ලක්ෂයක මුදල, මුදල් නීති පණතේ 39 (ඇ) වගන්තිය ප්‍රකාර ආණ්ඩුවට ගෙවන ලදී.

### විදේශ විනිමය

ශ්‍රී ලංකා රුපියල්වලට සාපේක්ෂව, එක්සත් ජනපද ඩොලර් සඳහා මහ බැංකුව විසින් කරන මිළදී ගැනීම් හා විකුණුම් අනුපාතිකයන් වැඩ කරන සෑම දිනකම පෙරවරුවෙහි ප්‍රකාශයට පත්කිරීම මහ බැංකුව විසින් තවදුරටත් සිදුකරගෙන යන ලද අතර, මෙම අනුපාතික අනුව මෙරට වාණිජ බැංකු සමග ගණුදෙනු කරනු ලැබීය. 1984 මාර්තු වන තුරු, ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉදිරි විනිමය ගණුදෙනු හය මාසයක කාලසීමාවක් සඳහා එක්සත් ජනපද ඩොලර් මිළදී ගැනීමට පමණක් සීමාවිය. 1984 මාර්තු 26 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුව, එක්සත් ජනපද ඩොලර්, රුපියල් සඳහා මිළට ගැනීමේ හා විකිණීමේ අනුපාතික ප්‍රකාශයට පත්කරමින් තුන් මාසයක කාල සීමාවක් සඳහා ඉදිරි විනිමය ගැනුම් හා විකුණුම් වෙළෙඳපොලට අවතීර්ණ විය. 1984 අවසානයේ දී, මහ බැංකුව විසින් එක් මසක් සඳහා වන විනිමය කොන්ත්‍රාත්තු මත එ.ජ. ඩොලර් එතැන් මධ්‍යම විනිමය අනුපාතිකය අනුව මිළට ගැනීම සිදු කළ අතර, එම කාලසීමාව සඳහා වන විකිණීම් ඩොලර් 100 සඳහා රුපියල් 7.50 ක අධි මිළක් යටතේ සිදුකරන ලදී. තෙමසක කාලයක් සඳහා වන ඉදිරි විනිමය ඩොලර් එතැන් මධ්‍ය විනිමය අනුපාතිකය ඩොලර් 100 සඳහා ශත 50 ක වට්ටමක් යටතේ මිළට ගැනීම ද රුපියල් 22 ක අධි මිළට විකිණීම ද සිදු කරන ලදී. ආසියානු නිෂ්කාශණ සංගමයේ ගිවිසුම යටතේ කරන ලද විදේශ ව්‍යවහාර මුදල් ගණුදෙනු වර්ෂය තුළ නොවෙනස්ව පැවතුණේය. එතැන් විකුණුම් හා මිළදී ගැනීම් ද, හය මාසයක් සඳහා වූ ඉදිරි විකුණුම් හා මිළදී ගැනීම්ද නොකඩවා කරගෙන යනු ලැබීය. උපයෝගී කරගන්නා ලද මුදල් වූයේ බංගලාදේශ ටාකා, බුරුම ක්යාට්, ඉන්දියානු රුපියල්, ඉරාන රියාල්, නේපාල රුපියල් සහ පාකිස්ථානු රුපියල්ය.

### ආසියානු නිෂ්කාශණ සංගමය

ඉකුත් වර්ෂයේ රුපියල් 461 කෝටි 80 ලක්ෂයක් වූ ප්‍රමාණය සමග සසඳන කල සමාලෝචිත වර්ෂය තුළ ආසියානු නිෂ්කාශණ සංගමය මගින් කැරුණ ගණුදෙනුවල මුළු වටිනාකම රුපියල් 737 කෝටි 5 ලක්ෂයක් විය. 1983 වර්ෂයේ රුපියල් 21 කෝටි 45 ලක්ෂයක් වූ ශුද්ධ ලැබීම් සමාලෝචිත වර්ෂයේදී රුපියල් 15 කෝටි එක් ලක්ෂයක් විය.

# මුදල් හා බැංකු ගණුදෙනු

ශ්‍රී ලංකා මහ බැංකුවේ

1984 දෙසැම්බර් මස 31 වැනි

## ව ග කී ම්

| 1983 දෙසැම්බර් මස 31 වැනි දින රුපියල් | | | 1984 දෙසැම්බර් මස 31 වැනි දින රුපියල් | |
|---|---|---|---|---|
| | | **ප්‍රාග්ධන ගිණුම්** | | |
| 1,50,00,000 | | ප්‍රාග්ධනය .. | 1,50,00,000 | |
| 6,80,00,000 | 8,30,00,000 | අතිරික්තය .. | 6,90,00,000 | 8,40,00,000 |
| | | **සංසරණයෙහි පවත්නා ව්‍යවහාර මුදල්** | | |
| 785,91,48,039 | | නෝට්ටු .. | 921,85,48,130 | |
| 31,43,97,956 | 817,35,45,995 | කාසි .. | 38,14,89,551 | 960,00,37,681 |
| | | **තැන්පතු** | | |
| 175,81,89,021 | | රජය .. | 134,43,26,827 | |
| 5,48,45,058 | | රාජ්‍ය නියෝජ්‍යත්ව හා ආයතන .. | 8,42,98,409 | |
| 341,32,45,644 | | වෙළෙඳ බැංකු .. | 402,55,40,681 | |
| 489,41,95,284 | | ජාත්‍යන්තර සංවිධාන, විදේශීය රාජ්‍ය හා විදේශීය බැංකු ආයතන .. | 507,55,81,166 | |
| 1,86,510 | | භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කළ රු. 13,24,46,250 හැර අනිවාර්ය ඉතිරිකිරීමේ අරමුදල .. | 57,181 | |
| 59,96,84,518 | 1,072,03,46,035 | අනෙකුත් .. | 59,02,14,937 | 1,112,00,19,201 |
| | 187,30,56,859 | විදේශීය ණය ගැනීම් .. | | 1,27,23,480 |
| | 77,50,00,000 | මධ්‍යම හා දිගුකාලීන ණය අරමුදල .. | | 77,50,00,000 |
| | 11,00,00,000 | ප්‍රාග්ධන දායක දීමනා ගිණුම .. | | 11,00,00,000 |
| | — | ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් | | 55,73,15,000 |
| | 1,136,19,57,704 | අනෙකුත් වගකීම් හා ගිණුම් .. | | 1,101,27,47,243 |
| | 3,309,69,06,593 | | | 3,327,18,42,605 |

## 1984 දෙසැම්බර් මස 31 වැනි දිනෙන්

| 1983 දෙසැම්බර් මස 31 වැනි දින රුපියල් | | | 1984 දෙසැම්බර් මස 31 වැනි දින රුපියල් |
|---|---|---|---|
| | 130,37,65,732 | සාමාන්‍ය වියදම් (වැටුප්, මුදල් නෝට්ටු හා කාසි සඳහා වියදම් හා බැංකු ගොඩනැගිලි හා කාර්යාල උපකරණ සඳහා ක්ෂයවීම් ඇතුළුව) සහ මුදල් නීති පණතේ 38 වැනි වගන්තිය ප්‍රකාර ඉන්පසුව කරන ලද වෙන් කිරීම් .. | 166,02,50,639 |
| | | 1984 දෙසැම්බර් 31 වැනිදායින් අවසන්වූ වර්ෂයේ ශුද්ධ ලාභය | |
| 58,642 | | මූල්‍ය ගැලපීම් ගිණුමට මුදල් නීති පණතේ 39 (අ) වගන්තිය ප්‍රකාර ශේෂය පියවීමට | |
| 10,00,000 | | මුදල් නීති පණතේ 39 (ආ) වගන්තිය ප්‍රකාර අතිරික්තයක් වශයෙන් යොදා ගන්නා ලදී. රු. 10,00,000 | |
| 165,00,00,000 | 165,10,58,642 | මුදල් නීති පණතේ 39 (ඇ) වගන්තිය ප්‍රකාර රජයට – ශ්‍රී ලංකා මහ බැංකුව වෙත නොපියවා ඇති වගකීම් කොටසක් පියවීමට රු. 150,04,61,262 | 150,14,61,262 |
| | 295,48,25,374 | | 316,17,11,901 |

**වර්ණසේන රාසපුත්‍රම්**
අධිපති

**එන්. ඒ. ධර්මබන්ධු**
ප්‍රධාන ගණකාධිකාරී

## ගිණුම්—1984

## දිනට ශේෂ පත්‍රය

### ව ත් ක ම්

| 1983 දෙසැම්බර් මස 31 වැනි දින රුපියල් | | | 1984 දෙසැම්බර් මස 31 වැනි දින රුපියල් | |
|---|---|---|---|---|
| | | ජාත්‍යන්තර සංචිතය | | |
| 600,39,52,062 | | පිටරට තිබෙන මුදල් හා බැංකු ශේෂයන් .. | 984,28,50,625 | |
| 122,25,99,773 | | *විදේශීය සුරැකුම්පත් හා භාණ්ඩාගාර බිල්පත් .. | 271,56,46,847 | |
| 2,04,37,101 | 724,69,88,936 | විශේෂ ගැනුම් හිමිකම්පත් | 54,17,574 | 1,256,39,15,046 |
| | | දේශීය වත්කම් | | |
| | | ණය සහ අත්තිකාරම් | | |
| 279,44,61,262 | | රජයට .. | 404,34,61,262 | |
| | | අනෙකුත් අයට– මධ්‍යම හා | | |
| 62,34,91,947 | | දීර්ඝකාලීන .. | 64,98,53,108 | |
| 232,11,22,015 | | කෙටිකාලීන .. | 166,23,01,280 | |
| 1,659,85,92,278 | | රජයේ සහ රජය සහතික කළ සුරැකුම්පත් .. | 1,120,56,74,601 | |
| 11,00,00,000 | 2,244,76,67,502 | මූල්‍ය සහ අනෙකුත් ආයතනවලට දායක දීමනා .. | 11,00,00,000 | 1,767,12,90,251 |
| | 340,22,50,155 | අනෙකුත් වත්කම් හා ගිණුම් .. | | 303,66,37,308 |
| | | *1964 පෙබරවාරි මස 01 වැනි දින රු. 55,27,675 ප්‍රකාශිත වටිනාකමට හා 1965 මැයි මස 24 වැනි දින රු. 57,450 ප්‍රකාශිත වටිනාකමට රජයේ ආයතනවලින් ලබාගත් සුරැකුම්පත් ඇතුළත් වෙයි. (ඒ දිනවල මෙකී සුරැකුම්පත්වල ඇස්තමේන්තු කළ වෙළඳ වටිනාකම පිළිවෙලින් රු. 29,33,697 ක් හා රු. 34,340 ක් විය.) | | |
| | 3,309,69,06,593 | | | 3,327,18,42,605 |

## අවසන් වූ වර්ෂයේ ලාභාලාභ ගිණුම

| 1983 දෙසැම්බර් මස 31 වැනි දින රුපියල් | | | 1984 දෙසැම්බර් මස 31 වැනි දින රුපියල් | |
|---|---|---|---|---|
| | 295,48,25,374 | පොළී, ඉපැයීම් ආදිය .. | | 316,17,11,901 |
| | 295,48,25,374 | | | 316,17,11,901 |

1984 දෙසැම්බර් මස 31 වැනි දිනට අවසන් වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ 154 (1) වගන්තිය සමග කියවන ලද 1971 අංක 38 දරණ මුදල් නීති පණතේ 13 (1) වගන්තිය සහ මුදල් නීති පණතේ (පරි. 422) 42 (1) වගන්තිය අනුව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

මුදල් නීති පණතේ (පරි. 422) 42 (2) වගන්තිය ප්‍රකාර මුදල් ඇමතිතුමා වෙත ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කෙරේ.

ඩබ්ලිව්. ජී. ඇපා
විගණකාධිපති.

කොළඹ 7,
විගණකාධිපති දෙපාර්තමේන්තුවේදීය,
1985 අප්‍රේල් 17 දින.

ණය සහ අත්තිකාරම්

රජයේ සහ රජය සහතික කළ සුරැකුම්පත් මත වාණිජ බැංකුවලට දෙනු ලබන කෙටි කාලීන පොදු අත්තිකාරම් පහසුකම, 1984 මාර්තු 26 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, මහ බැංකුව විසින් ඉවත් කර ගන්නා ලද අතර. පෙර නැව්ගත කිරීමේ අපනයන ණය ප්‍රතිමූල්‍ය පහසුකම වැඩි කරන ලදී.

මහ බැංකුව විසින් අපනයන සඳහා ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රම යටතේ වාණිජ බැංකුවලට ණය පහසුකම් සැළසීම වර්ෂය තුළදී එසේම කරගෙන යන ලදී. 1984 මාර්තු 26 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අපනයන ණය ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රමවල සංශෝධන කිහිපයක් කරන ලදී. ශ්‍රී ලංකාවේ අපනයන ප්‍රතිමූල්‍යනය කිරීම සඳහා භාවිතීය පොරොන්දු නෝට්ටු මත වාණිජ බැංකුවලට දෙන කෙටිකාලීන අත්තිකාරම් සඳහා වූ පොළී අනුපාතිකය වැඩි කරන ලදී. සම්ප්‍රදායික අපනයන (කාණ්ඩ I) සම්බන්ධ ප්‍රතිමූල්‍ය සඳහා වන පොළී අනුපාතිකය වර්ෂයකට සියයට 10 සිට සියයට 13 දක්වා වැඩි කරන ලද අතර, වාණිජ බැංකු විසින් සිය ගණුදෙනුකරුවන්ට සපයන ණයෙහි උපරිම පොළිය සියයට 13 සිට සියයට 16 දක්වා ඉහළ නංවන ලදී. සම්ප්‍රදායික නොවන අපනයන (කාණ්ඩ II) සම්බන්ධ වට්ටම් අනුපාතිකය සියයට 7 සිට සියයට 10 දක්වා වැඩි කරන ලද අතර, වාණිජ බැංකු විසින් සපයනු ලබන ණයෙහි පොළිය වට්ටම් කිරීම සම්බන්ධයෙන් සියයට 9.75 සිට 12.75 දක්වා ද, මූහුණත වටිනාකම සම්බන්ධයෙන් සියයට 10.8 සිට 13.8 දක්වා ද වැඩි කරන ලදී. විනිමය පාලක විසින් නියම කොට ඇති කාල සීමාව තුළ අදාළ අපනයන මගින් ලත් මුදල් ශ්‍රී ලංකාවට ලැබුණ විට ඒ හා අදාළ ප්‍රතිමූල්‍ය ණය මත වර්ෂයකට සියයට 4 ක් වූ ප්‍රතිදනයක් සිය ගණුදෙනුකරුවන් වෙත පෙරළා ලබා දීම සඳහා මහ බැංකුව විසින් වාණිජ බැංකු වෙත ආපසු ගෙවනු ලැබේ.

ඉහත සඳහන් කළ පරිදි, මීට පෙර පොදු අත්තිකාරම් පහසුකම් යටතේ දෙන ලද මුදල් ද එක් කිරීම මගින්, සම්ප්‍රදායික අපනයන සඳහා ලබා ගත හැකි ප්‍රතිමූල්‍ය ප්‍රමාණය වැඩි කරන ලදී. තවද, ඒ ඒ වාණිජ බැංකුවලට පනවා ඇති සීමාවන්ට පරිබාහිරව, තේ අපනයනය සඳහා වන පෙර නැව්ගත ඇසුරුම් ණය සඳහා අතිරේක ප්‍රතිමූල්‍ය ලබාදීමට මහ බැංකුව කටයුතු යොදා තිබිණි. කාණ්ඩ II යටතේ දෙන ප්‍රතිමූල්‍ය සඳහා සීමා පැනවීම නොකරන ලදී. තේ, රබර්, පොල්, ඇඟළුම්, මැණික්, මුහුදු ආශ්‍රිත නිෂ්පාදන හා ඛණිජ තෙල් නිෂ්පාදන හැර අනෙකුත් සියළුම අපනයන, කාණ්ඩ II යටතේ ප්‍රතිමූල්‍ය ණය සඳහා සුදුසුකම් ලැබිය. මෙකී කාණ්ඩ දෙකටම දෙනු ලබන ප්‍රතිමූල්‍ය දින 60 කට සීමාකර තිබූ අතර, එය එක් එක් අවස්ථාව පිළිබඳව සලකා බලා දින 30 ක දීර්ඝ කිරීමක් ද සහිතව දින 90 ක උපරිම කාලයකට යටත් ව තිබුණි.

ප්‍රතිමූල්‍ය ලබාගත් සියළුම අපනයන සඳහා ඉදිරි මිළදී ගැනීමේ ආවරණය ලබා ගත යුතු විය. එතෙක් රු. 5,00,000 ක හෝ ඊට වඩා අඩු වටිනාකමෙන්යුත් ස්ථිර ඇණවුම් හෝ ණයවර ලිපි වෙනුවෙන් කරනු ලබන අපනයන සම්බන්ධයෙන් මෙකී අවශ්‍යතාවය 1984 අප්‍රේල් 9 වැනි දින සිට ඉවත් කරන ලදී. ඉදිරි ගිවිසුමේ කාලසීමාව අදාළ ණයවර ලිපියේ කල් පිරෙන සීමාවට හෝ අපනයන ගිවිසුමේ සඳහන් නියමිත භාරදීමේ ආසන්න කාලසීමාවට සම්බන්ධ වන අතර, කුමන හේතුවක් නිසා වුව ද, එය හය මාසයක කාලපරිච්-ඡේදය නො ඉක්මවිය යුතු විය. ඉදිරි මිළදී ගත් විදේශ මුදල් ඒ අන්දමට ඉදිරි විකුණුම් සඳහා යෙදිය යුත්තේ අත්‍යවශ්‍ය ආනයන සඳහා පමණක් බවට වාණිජ බැංකු සහතික විය යුතුව තිබුණි. 1984 දී කාණ්ඩ I යටතේ රුපියල් 807 කෝටි 83 ලක්ෂයක මුදලක් ද, කාණ්ඩ II යටතේ රුපියල් 224 කෝටි 19 ලක්ෂයක මුදලක් ද, මහ බැංකුව විසින් ණය වශයෙන් දී තිබුණේය.

සමුපකාර සමිතිවලට හෝ වී, එළවළු සහ අනෙකුත් නියමිත ආහාර භෝග නිෂ්පාදනයේ නියැලෙන සියළුම පුද්ගලයන්ගේ හෝ භාවිතීය පොරොන්දු නෝට්ටු මත වාණිජ බැංකුවලට දෙනු ලබන මහ බැංකු අත්තිකාරම් සඳහා වූ පොළී අනුපාතිකය තවදුරටත් වර්ෂයකට සියයට 1.5 ක්ව පැවතුණි. 1984 දී මෙකී ක්‍රමය යටතේ දුන් ණය ප්‍රමාණය රුපියල් 21 කෝටි 97 ලක්ෂයක් විය. මහජන බැංකුවට/වී අලෙවි මණ්ඩලයට දෙන ලද ප්‍රතිමූල්‍ය හැර සමුපකාර සමිතිවලට, කෘෂි සේවා මධ්‍යස්ථානවලට හා බලය ලත් පුද්ගලයින්ට වී මිළදී ගැනීමටත්, ප්‍රාදේශිකව වගා කරනු ලබන අනෙකුත් සමහර විශේෂ භෝග වර්ග මිළදී ගැනීමට හා ගබඩා කර තැබීමටත්, භාවිතීය පොරොන්දු නෝට්ටු ඇපයට තබාගෙන වාණිජ බැංකු විසින් දෙනු ලබන අත්තිකාරම් වෙනුවෙන්, මහ බැංකුව විසින් වාණිජ බැංකුවලට දෙනු ලබන අත්තිකාරම්වල පොළී අනුපාතිකය සියයට 3 ක් වශයෙන් නොවෙනස්ව පැවතුණේය. ප්‍රතිමූල්‍ය ප්‍රමාණය රුපියල් කෝටි 40 කට වැඩියෙන් වූ කල අදළ අනුපාතිකය ප්‍රතිශත ඒකක 2 කින් වැඩි වන පරිදි සංශෝධනය කරන ලදී. මෙකී ක්‍රමය යටතේ වර්ෂය තුළ ගෙවන ලද මුදල රුපියල් 187 කෝටි 45 ලක්ෂයක් විය.

### මැදි හා දිගුකාලීන ණය අරමුදල

1984 වර්ෂය තුළදී මහ බැංකුව විසින් මැදි හා දිගුකාලීන ණය අරමුදල යටතේ ප්‍රතිමූල්‍ය සැපයීමේ ක්‍රමය තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී. 1984 දී ලබා දෙන ලද මුළු ප්‍රතිමූල්‍ය ප්‍රමාණය රුපියල් 16 කෝටි 90 ලක්ෂයක් වූ අතර, ලබාගත් මුළු ආපසු ගෙවීම් ප්‍රමාණය රුපියල් 14 කෝටි 26 ලක්ෂයක් විය. මැදි හා දිගුකාලීන ණය අරමුදල යටතේ වූ ශේෂය රුපියල් 77 කෝටි 50 ලක්ෂයක් විය. මෙයින් රුපියල් 64 කෝටි 99 ලක්ෂයක් මුදා හරිනු ලැබ ණය දෙන ආයතන මගින් නොපියවා ඉතිරිව ඇති ඒවා විය.

### වාණිජ බැංකු ණය

1984 මාර්තු 26 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය සඳහා දී ඇති සිය මුළු අත්තිකාරම් ප්‍රමාණය, 1984 මාර්තු 23 වැනි දින දක්වා දෙන ලද, එහෙත් නොපියවා ඇති අත්තිකාරම් ප්‍රමාණය නො ඉක්මවීමට වාණිජ බැංකු විසින් වග බලා ගත යුතු බව මහ බැංකුව විසින් නියම කරන ලදී. එසේම, අත්‍යාවශ්‍ය නොවන භාණ්ඩ ආනයනයෙහිලා තුති ආනයනකරුවන්ට වාණිජ බැංකු විසින් දෙන ණය ප්‍රමාණය 1984 මාර්තු 23 වැනි දිනට නොපියවා පැවති මට්ටම නො ඉක්මවිය යුතු යැයි ද මහ බැංකුව විසින් නියම කරන ලදී. මෙකී සීමා කිරීම්වලට අමතරව, අපනයන හා කෘෂිකාර්මික කටයුතුවලින් බැහැරව පෞද්ගලික අංශයට ලබා දී නොපියවා ඇති අත්තිකාරම් ප්‍රමාණය, 1984 මැයි 11 වැනි දිනට එසේ ලබා දී නොපියවා ඇති මුළු අත්තිකාරම් ප්‍රමාණයෙන් සියයට 5 ක් නො ඉක්මවිය යුතු බවට වගබලා ගන්නා ලෙස වාණිජ බැංකුවලට මහ බැංකුව විසින් නියම කරන ලදී.

### සංචිත නියමයන්

වාණිජ බැංකු මත පනවන ලදුව පවත්නා සංචිත නියමයන්ට අමතරව, 1984 නොවැම්බර් 23 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, විශේෂ සංචිත නියමයක් මහ බැංකුව විසින් පනවන ලදී. රුපියල් තැන්පතු වශයෙන් විශේෂ සංචිත මහ බැංකුවේ පවත්වාගෙන යාම අවශ්‍ය බවට නියම කැරිණි. 1984 නොවැම්බර් 14 වැනි දිනට පැවති තැන්පතු මට්ටමට වඩා ඉහළ ගිය ප්‍රමාණය පදනම් කර ගෙන, ඉල්ලුම් තැන්පතු වගකීම් සහ කාලීන හා ඉතිරිකිරීම් තැන්පතු වගකීම් සම්බන්ධයෙන් මෙකී සංචිත ප්‍රමාණයන් තීරණය කරන ලදී. විශේෂ සංචිත වශයෙන් පවත්වා ගත යුතු එකී ප්‍රමාණය තීරණය කරන ලද්දේ වැඩිවීම් කොටස් පදනම් කරගෙනය. වැඩිවීම් කොටස් හා ඒ ඒ කොටස් සම්බන්ධයෙන් සංචිත වශයෙන් පවත්වා ගත යුතු ප්‍රමාණයන් ද පහත දක්වේ.

| කොටස | | විශේෂ සංචිත ප්‍රමාණය |
|---|---|---|
| (i) සියයට 3 දක්වා | ... | නැත |
| (ii) සියයට 3 සිට 6 දක්වා | ... | වැඩිවීමෙන් සියයට 5 ක් |
| (iii) සියයට 6 සිට 10 දක්වා | ... | වැඩිවීමෙන් සියයට 10 ක් |
| (iv) සියයට 10 ට වැඩි | ... | වැඩිවීමෙන් සියයට 15 ක් |

**භාණ්ඩාගාර බිල්පත්**

ද්විතීය වෙළෙඳ පොළේ භාණ්ඩාගාර බිල්පත් සම්බන්ධ ගනුදෙනු මහ බැංකුව විසින් දිගටම පවත්වාගෙන එන ලදී. භාණ්ඩාගාර බිල්පත් විකුණුම් 1983 රුපියල් 1,894 කෝටි 69 ලක්ෂයක සිට 1984 රුපියල් 3,983 කෝටි 56 ලක්ෂයක් දක්වා තීව්‍ර ලෙස ඉහළ නැංගේය. මිළදී ගැනීම් ද 1983 රුපියල් 1,266 කෝටි 88 ලක්ෂයේ සිට 1984 රුපියල් 2,567 කෝටි 74 ලක්ෂය දක්වා ඉහළ නැංගේය. ඒක්ෂණ මුදල් වෙළෙඳ පොළේ අනුපාතික සහ ද්විතීය භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳ පොළේ අනුපාතික අතර ඇති අඩුවෙමින් යන ඉපැයීම් ආන්තරය, මෙම ක්‍රමය යටතේ වූ කටයුතුවල විශාල වර්ධනයට ප්‍රධාන හේතුව විය.

**පෙරළා සියරට යන ඉන්දියානුවන් වෙත ආධාරක හා කරුණා සහගත ගෙවීම්**

1964 ඉන්දු-ලංකා ගිවිසුම යටතේ ගැනෙන ඉන්දියානු සම්භවය ඇති වතු කම්කරුවන් පෙරළා සිය රට යැවීම ඉක්මන් කරවනු පිණිස රජය වෙනුවෙන් ක්‍රම දෙකක් ක්‍රියාත්මක කරවීම බැංකුව විසින් නොකඩවා කරගෙන යන ලදී. මේවා නම් ;

(අ) එසේ පෙරළා සිය රට යන්නන්හට ප්‍රේෂණය කිරීමට බලය දෙන ලද ප්‍රමාණයෙන් සියයට 65 කට සමාන මුදලක් හෝ ඉන් කොටසක් ආධාර වශයෙන් ගෙවීම; සහ

(ආ) මෙකී කම්කරුවන්ට ශ්‍රී ලංකාව හැර යෑමට දිරි ගැන්වීමක් වශයෙන් කරුණා සහගත ගෙවීමක් ලෙස රුපියල් 500 ක් හා එම මුදලින් සියයට 65 ක් ගෙවීම.

බැංකුව, මේ ක්‍රම දෙකම වාණිජ බැංකු මගින් ක්‍රියාත්මක කරවන ලදී. 1984 දී ආධාරක ක්‍රමය යටතේ පෙරළා සිය රට යන්නන්හට ගෙවන ලද මුදල් ප්‍රමාණය රුපියල් එක් කෝටි 16 ලක්ෂයකි. පසුගිය වර්ෂයේදී එසේ පෙරළා සිය රට ගියවුන් 5,937 දෙනෙකු සඳහා ගෙවන ලද කරුණා සහගත ගෙවීම් ප්‍රමාණය රුපියල් 49 ලක්ෂයකි.

**අනිවාර්ය ඉතිරි කිරීමේ අරමුදල**

1971 අංක 6 දරන අනිවාර්ය ඉතිරිකිරීමේ පනත හා 1972 අංක 15 දරන ආදායම් සීමා කිරීමේ සහ අනිවාර්ය ඉතිරිකිරීමේ නීතිය යටතේ එකතු කරන ලද මුදල්වල භාරකරු වශයෙන් තවදුරටත් ක්‍රියා කළ මහ බැංකුව, රජය වෙනුවෙන් අනිවාර්ය ඉතිරිකිරීමේ අරමුදල පරිපාලනය කළේය. වර්ෂය තුළදී බැංකුව විසින් ප්‍රතිලාභ ආපසු ගෙවීමේ ඉල්ලුම් පත් 1,273 ක් මත රුපියල් 59 ලක්ෂයක් (පොලිය ද ඇතුළුව) දායකයින්ට ගෙවන ලදී.

**රාජ්‍ය ගිණුම්**

බැංකු කටයුතු දෙපාර්තමේන්තුවේ රාජ්‍ය ගිණුම් ශාඛාව, රජයේ බැංකුකරු වශයෙන් රාජ්‍ය දෙපාර්තමේන්තුවල, රාජ්‍ය නියෝජ්‍යත්ව සහ ආයතනවල හා සමහර ව්‍යවස්ථාපිත මණ්ඩලවල ගිණුම් තවදුරටත් පවත්වාගෙන යනු ලැබීය. 1984 දෙසැම්බර් අවසානයේදී රාජ්‍ය ගිණුම් අංශයෙහි වූ සක්‍රිය ගිණුම් සංඛ්‍යාව 157 කි. (රාජ්‍ය දෙපාර්තමේන්තු 142 හා වෙනත් 15)

## ව්‍යවහාර මුදල් නිකුතුව

1984 දෙසැම්බර් 31 වැනි දිනට මුළු ව්‍යවහාර මුදල් සංසරණය රුපියල් 960 කෝටියක් විය. මෙය, ඊට පෙර වර්ෂයෙහි වූ රුපියල් 817 කෝටි 35 ලක්ෂයට වඩා රුපියල් 142 කෝටි 65 ලක්ෂයක වැඩිවීමකි. පසුගිය වර්ෂයට වඩා 1984 වර්ෂය තුළදී මුදල් නෝට්ටු සංසරණය රුපියල් 135 කෝටි 94 ලක්ෂයකින් වැඩි වූ අතර කාසි සංසරණය රුපියල් 6 කෝටි 71 ලක්ෂයකින් වැඩි විය.

සමාලෝචිත වර්ෂය තුළ වැඩි වටිනාකමින් යුත් ව්‍යවහාර මුදල් නෝට්ටු සඳහා වූ ඉල්ලුම් රටාවේ වෙනසක් සටහන් කෙරුණි. එනම්, 1983 වර්ෂය තුළ එකී නෝට්ටු සඳහා පැවතුන සමස්ත ඉල්ලුමට වඩා 1984 වර්ෂය තුළ සියයට 23.5 ක අඩුවීමක් වාර්තාගත විමයි. වැඩි වටිනාකමින් යුත් රුපියල් 1,000 සහ රුපියල් 500 නෝට්ටු සඳහා වූ ඉල්ලුමෙහි මීට පෙර වර්ෂයෙහි සැළකිය යුතු වැඩිවීමක් වාර්තාගත වූ නමුදු, ඉල්ලුම් රටාවේ පසුබෑමක් පෙන්නුම් කරමින් පිළිවෙලින් රුපියල් 24 කෝටි 10 ලක්ෂයක සහ රුපියල් 10 කෝටි 90 ලක්ෂයක පහත වැටීමක් ඇති වූ බව දක්නට ලැබුණි.

කාසි නිකුතුව සම්බන්ධයෙන් සළකන කල සමාලෝචිත වර්ෂය තුළ වැඩි වටිනාකමින් යුත් කාසි සඳහා නිරන්තර වැඩි වන ඉල්ලුමක් ඇති බව දක්නට ලැබුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1984 වර්ෂයේදී වැඩි වටිනාකමින් යුත් රුපියල් 1, සත 50 සහ සත 25 කාසි සඳහා විශේෂ ඇණවුම් භාර දෙන ලදී. රුපියල් 5 සහ රුපියල් 2 නෝට්ටු වෙනුවට කාසි නිකුත් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. අළුත් මෝස්තරවල කාසි 1985 වර්ෂය මුලදී නිකුත් කිරීමට ඇති අතර, නෝට්ටු අනුක්‍රමයෙන් සංසරණයෙන් ඉවත් කරගන්නා තෙක් නෝට්ටු සමඟ එකී කාසි සංසරණය වනු ඇත.

## බැංකු සංවර්ධන

1984 වර්ෂය අවසාන වනවිට දේශීය බැංකු හතරකින් හා විදේශීය බැංකු 21 කින් සමන්විතව වාණිජ බැංකු 25 ක් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මකව පැවතිණ. විදේශීය බැංකු නියෝජිත කාර්යාල දෙකක් හා වණික් බැංකු සමාගම් දෙකක් ද රට තුළ ව්‍යාපාරික කටයුතුවල නියුක්ත විය. වර්ෂය තුළදී, ශ්‍රී ලාංකික බැංකු විසින් ශාඛා 13 ක් සහ එක් ගෙවීම් කාර්යාලයක් විවෘත කරන ලදී. 1984 මැයි 5 වැනි දින, කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපය තුළ සීමාසහිත බෑන්ක් ඔෆ් ක්‍රෙඩිට් ඇන්ඩ් කොමර්ස් බැංකුවේ ශාඛාවක් විවෘත කරන ලදී. මේ අනුව, 1984 වර්ෂය අවසානයේදී මුළු බැංකු ශාඛා සංඛ්‍යාව 1,022 ක් වූ අතර, එයින් කෘෂි සේවා මධ්‍යස්ථාන ශාඛා 59 ක්ද, ඇතුළුව බැංකු ශාඛා 647 ක් ක්‍රියාත්මක විය. ඉතිරිය, වෙනත් ස්ථානවලට ගෙන යන ලද කෘෂි සේවා මධ්‍යස්ථාන ශාඛා, ගෙවීම් කාර්යාල, කච්චේරි ශාඛා සහ ව්‍යාප්ති කාර්යාල වලින් සමන්විත විය. මේ අතරතුර, ඇමරිකන් එක්ස්ප්‍රස් ඉන්ටර්නැෂනල් බෑන්කින් කෝපරේෂන්හි ආසියානු ප්‍රාදේශීය කාර්යාලය කොළඹ පිහිටුවීමට අනුමැතිය දෙනු ලැබූ අතර, එහි ව්‍යාපාරික කටයුතු 1984 මැයි මාසයේදී ආරම්භ කරන ලදී.

## බැංකු පරිපාලන

මුදල් නීති පනතේ 29(1) වගන්තිය යටතේ 1984/1985 පරීක්ෂණ කාලය තුළදී, බැංකුව විසින් වාණිජ බැංකු දහයක පරීක්ෂණ කටයුතු ආරම්භ කරන ලද අතර, ඉන් පරීක්ෂණ හතරක් නිම කරනු ලැබීය. ඊට අමතරව, ඔවුන් විසින් සපයන ලද මාසික, ත්‍රෛමාසික හා වාර්ෂික ප්‍රකාශන අනුව වාණිජ බැංකු කටයුතු අධීක්ෂණය නොකඩවා කරගෙන යනු ලැබිණ. මුදල් නීති පනතේ 29(2) වගන්තිය යටතේ බැංකුව, වාණිජ බැංකුවක් නොවන බැංකු ආයතනයක සමීක්ෂණ කටයුතු ද ආරම්භ කරන ලදී.

1979 අංක 27 දරන මුදල් සමාගම් පාලන පනතේ විධිවිධානයන්ට අනුව, මුදල් මණ්ඩලය වෙත ලියාපදිංචි වී ඇති මුදල් සමාගම් අධීක්ෂණය හා පරීක්ෂණය කිරීම 1984 වර්ෂයේද නොකඩවා කරගෙන යන ලදී. පනතේ 15(1) ඡේදය යටතේ මුදල් සමාගම් දහ අටක පරීක්ෂණ

කටයුතු 1984 වර්ෂය තුළදී ආරම්භ කරන ලද අතර, ඉන් දොළහක පරීක්ෂණ කටයුතු අවසන් කරනු ලැබීය. 1983 දී ආරම්භ කරන ලද මුදල් සමාගම් දෙකක පරීක්ෂණ කටයුතු ද, වර්ෂය තුළදී නිම කැරිණ. වසර තුළදී පනත යටතේ ලියාපදිංචි කිරීම සඳහා මුදල් සමාගම් වලින් ලද ඉල්ලුම්පත් අගැයීම් කරන ලද අතර, සමාගම් හතරක් මුදල් මණ්ඩලයේ ලියාපදිංචි කරන ලදී. ද්‍රවශීලතාවය, ප්‍රාග්ධන අනුපාතිකය සහ සංචිත අරමුදලට කරන ලද පැවරීම් ආදිය පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින් මුදල් සමාගම් විසින් සපයන ලද මාසික ප්‍රකාශන සහ වාර්ෂික ලාභාලාභ ගිණුම් හා ශේෂපත්‍ර විශ්ලේෂණයට භාජනය කෙරිණ.

විදේශ ව්‍යවහාර මුදල් බැංකු ක්‍රමය යටතේ, වාණිජ බැංකු විසින් පිහිටුවන ලද, විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක ගණුදෙනු පිළිබඳව විමසිලිමත්ව සිටීමේ වැඩ පිළිවෙලෙහි බැංකුව තවදුරටත් නිරත විය.

## සංවර්ධන මුදල්

1984 වර්ෂයේදී මහ බැංකුව මගින් මැදි හා දිගුකාලීන ආයෝජන කටයුතු සඳහා අනුමත කරන ලද ප්‍රතිමූල්‍ය රුපියල් 12 කෝටි 96 ලක්ෂයක මධ්‍යස්ථ මට්ටමක පැවතුණි. කෙසේ වුව ද, ඊට පෙර වර්ෂයෙහි අනුමත කෙරුණ රුපියල් 7 කෝටි 48 ලක්ෂයට වඩා මෙහි සැළකිය යුතු වැඩිවීමක් පෙන්නුම් කැරිණ. අපනයන අංශය සඳහා දෙන ලද ප්‍රතිමූල්‍ය 1983 වර්ෂයේ පැවතුන රුපියල් 3 කෝටි 70 ලක්ෂයේ සිට රුපියල් 7 කෝටි 91 ලක්ෂය දක්වා 1984 වර්ෂයේදී වැඩි වූ අතර කර්මාන්ත සඳහා දෙන ලද ප්‍රතිමූල්‍ය පහසුකම් රුපියල් 70 ලක්ෂයේ සිට රුපියල් 4 කෝටි 91 ලක්ෂය දක්වා වැඩි විය. ප්‍රතිමූල්‍ය සඳහා වූ කොන්දේසි 1984 වර්ෂයේදීද නොවෙනස්ව පැවතුනේ වුව ද, සංචාරක කටයුතු සහ වාණිජ ගොඩනැගිලි ඉදිකිරීම සඳහාත් ප්‍රතිමූල්‍ය පහසුකම් මෙම වර්ෂය තුළ දී සපයනු නොලැබුණි.

සංචාරකයින්ගේ පැමිණීම පහත වැටීම හෝටල් අංශයෙහි විශාල ද්‍රවශීලතා අර්බුදයකට තුඩු දුන් අතර, 1984 වර්ෂයේදී මෙයට කිසියම් සහන වැඩ පිළිවෙලක් ඇති කිරීමේ අවශ්‍යතාවයක් ඇති විය. මේ අනුව, රජයේ නිර්දේශයක් මත බැංකු ආයතන සමඟ සාකච්ඡාවන් කීපයක්ම පැවැත්වීමෙන් පසු, මහ බැංකුව 1984 සැප්තැම්බර් මාසයේදී හෝටල්වලට සහන ගණනාවක්ම ලබා දෙන බව ප්‍රකාශ කර සිටියේය. මෙකී සහනයන්ට 1987 මාර්තු දක්වා ණය වාරික හා පොළී ගෙවීම තාවකාලිකව අත්හිටුවීම හා නොපියවා ශේෂ වී ඇති ණය ගෙවීමේ කාලය තවත් දීර්ඝ කිරීම සඳහා නැවත ලේඛනගත කිරීම ද ඇතුළත් විය. මෙහිදී බැංකුවලට ඇතිවූ ද්‍රවශීලතා පිළිබඳ අපහසුව මඟ හරවා ගැනීම සඳහා සහන සැළසීමක් වශයෙන් හිඟ හිටුවා ඇති පොළී මුදලෙන් සියයට 60 ක් සඳහා ප්‍රතිමූල්‍ය සැපයීමට මහ බැංකුව ඉදිරිපත් විය. ණය නැවත ලේඛනගත කිරීමේ කාර්යය සෙමින් සිදුවුව ද, 1984 දෙසැම්බර් වන විට හෝටල් ව්‍යාපෘති 40 කට ආසන්න සංඛ්‍යාවක් නැවත ලේඛනගත කිරීම සඳහා සැළකිල්ලට භාජනය වෙමින් පැවතුණි.

දෙවැනි සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ණය ක්‍රමයේ (සුමක II) සැහෙන ප්‍රගතියක් 1984 දී දක්නට ලැබුණද, අරමුදල් යෙදවීම පහත් මට්ටමක පැවතුණි. ලෝක බැංකුවත්, රජය හා සහභාගී වූ ණය දෙන ආයතනත් සමග විමර්ශන රැස්වීම් මාලාවක් පැවැත්වීමෙන් අනතුරුව, සුමක ණය යටතේ ණය දෙන ආයතනවලට ලැබෙන අන්තරය 1984 සැප්තැම්බර් මාසයේදී සියයට 5 සිට සියයට 7 දක්වා වැඩි කරන ලදී. එසේම, මී මැසි පාලනය, මල් වැවීම, වාණිජමය පදනමක් මත භාණ්ඩ ප්‍රවාහනය, වාණිජ මට්ටමින් සතුන් ඇති කිරීම, කොළඹින් පිට ප්‍රදේශවලදී වර්ණ ඡායාරූප සැකසීම හා ස්ථාවර කාරක ප්‍රාග්ධන මූල්‍යකරණය ආදී කටයුතු සුමක ණය සඳහා සුදුසුකම් ලැබිය යුතු බවට තීරණය කරන ලදී. ප්‍රධාන සුමක ණය වලින් සියයට 40 ට ආසන්න සංඛ්‍යාවක් සම්බන්ධයෙන්, 1983 දෙසැම්බර් වනවිට ණය ආපසු ගෙවීම හිඟහිටුවා තුබූ හෙයින්, ඍජු ව්‍යාපෘති පරීක්ෂණ මගින් (දිවයිනේ සෑම ප්‍රදේශයකම පාහේ 1984 දී

පරීක්ෂණ 243 ක් පැවැත්විණි) පසු විපරම් කටයුතු මහ බැංකුව විසින් දැඩි කරන් ලදී. පසු විපරම් කටයුතු ප්‍රධාන වශයෙන් අරමුණු කරන ලද්දේ, ගැටළු හඳුනා ගැනීම, පුනරුත්ථාපනය කිරීම සඳහා උපදෙස් සැපයීම හා අවසානයේ ණය ආපසු ලබා ගැනීම ආදිය කෙරෙහිය. පසු විපරම් කටයුතුවලට මහ බැංකුව කෙලින්ම සහභාගි වීම නිසා ණය නැවත ලේඛනගත කිරීම හා අඩපණ වූ ව්‍යාපෘති පුනරුත්ථාපනය කිරීම සඳහා අමතර පහසුකම් ලබා දීමටත් හැකි වී ඇති බව පෙනී යයි. එසේම, මහ බැංකුව පරීක්ෂණ පැවැත්වීමට පටන් ගත් පසු ණය ආපසු ගෙවීම පැහැර හැර සිටි බොහෝ දෙනෙකු නැවතත් ණය ආපසු ගෙවීමට පටන්ගෙන ඇති බවද පෙනී ගොස් ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, වාරික තුනකට වඩා හිඟ හිටුවා තිබූ මහ බැංකුවේ සහතික ක්‍රමය යටතේ සහතික කරන ලද ණය සංඛ්‍යාව 1983 දෙසැම්බර් මාසයේදී 966 ක් වූ නමුත්, 1984 දෙසැම්බර් මාසයේ දී එය 850 දක්වා අඩු විය.

**මැදි හා දිගුකාලීන ණය අරමුදලේ කටයුතු**

මැදි හා දිගුකාලීන ණය අරමුදලේ II, III හා IV කාණ්ඩ යටතේ රුපියල් 12 කෝටි 96 ලක්ෂයක් සඳහා වූ ඉල්ලුම්පත්‍ර 45 ක් අනුමත කරන ලදී. මෙයින් ඉල්ලුම්පත්‍ර 25 ක් මෙම ක්‍රමයේ II කාණ්ඩය යටතේ වූ අපනයන නැඹුරුවක් ඇති ව්‍යාපෘතීන් සඳහා වූ අතර, ඒ වෙනුවෙන් දෙන ලද ප්‍රතිමූල්‍ය ප්‍රමාණය රුපියල් 7 කෝටි 91 ලක්ෂයක් විය. වර්ෂය තුළ කර්මාන්ත ව්‍යාපෘති සඳහා ඉල්ලුම්පත්‍ර 17 ක් විය. ඒ සඳහා දෙන ලද ප්‍රතිමූල්‍ය ප්‍රමාණය රුපියල් 4 කෝටි 91 ලක්ෂයක් විය. ප්‍රතිමූල්‍ය අනුමත කිරීම් පිළිබඳ කැඩි සටහනක් 2.2 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. 1983 වාර්ෂික වාර්තාවේ දක්වා ඇති ප්‍රතිමූල්‍ය ණය කොන්දේසි හා විධිවිධාන නොවෙනස්ව පැවතුණි.

**2 . 2 සංඛ්‍යා සටහන**

**මැදි හා දිගුකාලීන ණය අරමුදල**

**(කාණ්ඩ II—IV ප්‍රතිමූල්‍ය අනුමත කිරීම්)**

රුපියල් දශ ලක්ෂ

| කාණ්ඩය | 1982 | | 1983 | | 1984 | |
|---|---|---|---|---|---|---|
| | ණය ප්‍රමාණය | ප්‍රතිමූල්‍ය ප්‍රමාණය | ණය ප්‍රමාණය | ප්‍රතිමූල්‍ය ප්‍රමාණය | ණය ප්‍රමාණය | ප්‍රතිමූල්‍ය ප්‍රමාණය |
| II. අපනයන අංශය .. | 97·7 | 97·7 | 43·7 | 36·5 | 113·0 | 79·1 |
| III. හා IV. | | | | | | |
| (අ) කෘෂිකර්මය .. | 1·0 | 1·0 | 27·8 | 19·2 | 0·1 | 0·1 |
| (ආ) කර්මාන්ත .. | 65·0 | 53·4 | 9·7 | 7·0 | 98·2 | 49·1 |
| (ඇ) හෝටල් .. | 75·3 | 72·5 | 13·2 | 8·6 | — | — |
| (ඈ) අනෙකුත් .. | 8·3 | 5·0 | 5·8 | 3·5 | 2·2 | 1·3 |
| එකතුව | 247·3 | 229·6 | 100·2 | 74·8 | 213·5 | 129·6 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

**ණය සහතික කටයුතු**

ණය සහතික කටයුතු පිළිබඳ සංක්ෂිප්ත සටහනක් 2.3 සංඛ්‍යා සටහනේ දක්වා ඇත.

**සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත (සුමක I) ණය සහතික ක්‍රමය**

සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ණය සහතික ක්‍රමය (සුමක 1) යටතේ ණය දෙන ආයතන විසින් දෙනු ලැබූ රුපියල් 28 කෝටි 23 ලක්ෂයක් සඳහා වූ ණය සහතික 1,657 ක් මහ බැංකුව විසින් නිකුත් කරන ලදී. 1984 දෙසැම්බර් වනවිට එකී ණය වලින් 476 ක් සම්පූර්ණයෙන් ආපසු අයකරගනු ලැබීය. ඉතිරි ණය දීම් 1,081 න් 619 ක් හිඟ හිටුවා තිබුණි. එසේ වුව ද, මේ ක්‍රමය යටතේ මේ දක්වා ආපසු අය කරගත් මුළු ණය ප්‍රමාණය රුපියල් 13 කෝටි 8 ලක්ෂයක්

## 2 . 3 සංඛ්‍යා සටහන

### ශ්‍රී ලංකා මහ බැංකුවේ ණය සහතික ක්‍රම 1983 – 1984

රුපියල් දශලක්ෂ

| ශීර්ෂය | සුළු පරිමාණ කර්මාන්ත (සු. පරි. ක.) | | | | සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත (සු. ම. ක. I) | | | | සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත (සු. ම. ක. II) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1983 | | 1984 | | 1983 | | 1984 | | 1983 | | 1984 | |
| | සංඛ්‍යාව | ප්‍රමාණය | සංඛ්‍යාව | ප්‍රමාණය | සංඛ්‍යාව | ප්‍රමාණය | සංඛ්‍යාව | ප්‍රමාණය | සංඛ්‍යාව | ප්‍රමාණය | සංඛ්‍යාව | ප්‍රමාණය |
| අනුමත කරන ලද ණය .. | 767 | 31·2 | 767 | 31·2 | 1585 | 265·7 | 1657 | 282·3 | 185(ඉ) | 43·9 | 372 | 141·0 |
| සහතික කරන ලද ණය .. | 767 | 23·4(අ) | 767 | 23·4(අ) | 1585 | 146·5 | 1657 | 155·5 | 185(ඉ) | 25·0 | 372 | 77·4 |
| සම්පූර්ණයෙන් අයකර ගත් ණය | 373 | ලැ.නො. | 441 | 11·4 | 193 | 8·6 | 476 | 28·6 | 4 | 0·4 | 11 | 1·3 |
| කල් ඉකුත් වූ/ඉවත් කර ගන්නා ලද ණය සහතික .. | 58 | ලැ.නො. | 61 | 3·6 | 29 | 7·7 | 45 | 11·4 | 11 | 0·8 | 15 | 2·4 |
| නොපියවූ ණය .. | 315 | 8·73(ආ) | 229 | 6·09(ආ) | 1349 | 159·7(ආ) | 1081 | 151·5(ආ) | 170 | 43·0(ආ) | 346 | 116·5(ආ) |
| ඉන් හිඟ ණය .. | 224 | ලැ.නො. | 173 | 5·0 | 697 | 103·3 | 619 | 91·9 | 45 | 5·4 | 58 | 11·5 |
| නොපියවූ ණය සහතික .. | 315 | 6·54(අ) | 229 | 4·57 (අ) | 1349 | 90·9(ඇ) | 1081 | 86·6(ඈ) | 170 | 24·4(ඈ) | 346 | 65·2(ඈ) |
| වගකීම් පිළිගන්නා /පියවන ලද හිමිකම් පෑම් | | | | | | | | | | | | |
| (i) නොපියවූ ණය .. | 20 | 0·64 | 35 | 1·25 | 14 | 0·187 | 50 | 3·04 | — | — | — | — |
| (ii) වගකීම් පිළිගත් .. | 20 | 0·41 | 35 | 0·75 | 14 | 0·112 | 50 | 1·82 | — | — | — | — |
| කටයුතු අවසන් නොවූ හිමිකම් පෑම් | | | | | | | | | | | | |
| (i) නොපියවූ ණය .. | 29 | 1·66 | 23 | 1·41 | 89 | 12·8 | 88 | 16·3 | — | — | 3 | 0·22 |
| (ii) හිමිකම් පෑ ප්‍රමාණය .. | 29 | 1·25 | 23 | 1·06 | 89 | 7·68 | 88 | 9·8 | — | — | 3 | 0·13 |

(අ) නොපියවූ ණය වලින් සියයට 75 ක ප්‍රමාණය.
(ආ) අය කර ගත් ණය වාරික හැර
(ඇ) රු. 4,00,000 උපරිමයකට යටත්ව නොපියවා පැවති ණයවලින් සියයට 60 ක ප්‍රමාණය.
(ඈ) රු. 8,00,000 උපරිමයකට යටත්ව නොපියවා පැවති ණයවලින් සියයට 60 ක ප්‍රමාණය.
(ඉ) 1984 වර්ෂය තුළදී සුමක 1 යෝජනා ක්‍රමයට මාරු කරන ලද ණය සහතික වීම 25 ක්ද ඇතුළුව.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

හෙවත් දී ඇති මුළු ණය ප්‍රමාණයෙන් සියයට 46 ක් විය. අනෙක් අතට, එසේ හිඟ හිටුවා ඇති ණය දීම් 619 ට අදාළ මුදල් ප්‍රමාණය දෙන ලද මුළු ණයෙන් සියයට 33 කි. 1984 දෙසැම්බර් වනවිට බැංකු විසින් ණය දීම් 138 ක ණය සහතික මත ලැබිය යුතු හිමිකම් ඉල්ලා සිටින ලදී. එසේම, ඒ වන විට මහ බැංකුව විසින් රුපියල් 18 ලක්ෂයක් සඳහා වූ හිමිකම් පෑම් 50 ක් භාර ගෙන නැතහොත් ගෙවා නිම කර තිබුණි. රුපියල් 8,84,239 ක් සඳහා වූ හිමිකම්පෑම් 5 ක් මහ බැංකුව විසින් ප්‍රතික්ෂේප කරන ලදී.

ලැබී ඇති තොරතුරු අනුව සුමක 1 යටතේ වූ ව්‍යාපෘති 139 ක් අත්හැර දමා ඇත. සුමක I ණය, කර්මාන්ත අනුව වර්ග කර 2.4 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

## 2 . 4 සංඛ්‍යා සටහන

### සුමක I යෝජනා ක්‍රමය – කර්මාන්ත අනුව ණය වර්ගීකරණය

රුපියල් '000

| කර්මාන්තය | 1979 – 1984 | | | 1984 | | |
|---|---|---|---|---|---|---|
| | ණය ගණන | අනුමත කළ ප්‍රමාණය | සහතික කළ ප්‍රමාණය | ණය ගණන | අනුමත කළ ප්‍රමාණය | සහතික කළ ප්‍රමාණය |
| 1. වී කෙටීම .. | 355 | 53,813 | 31,682 | 10 | 1,703 | 972 |
| 2. ලුහු ඉංජිනේරු .. | 185 | 28,507 | 15,510 | 13 | 1,988 | 1,193 |
| 3. ගඩොල් සහ අනෙකුත් ගොඩනැගිලි ද්‍රව්‍ය .. | 255 | 52,567 | 29,333 | 4 | 1,883 | 990 |
| 4. මසා නිමකළ ඇඳුම්, බතික්, අත් යන්ත්‍ර රෙදිපිළි, බුමුතුරුණු ආදිය .. | 140 | 21,744 | 11,367 | 2 | 830 | 418 |
| 5. රබර් හා රබර් උපයෝගී කර ගත් භාණ්ඩ .. | 31 | 9,116 | 4,590 | 1 | 250 | 150 |
| 6. පාවහන් හා අනෙකුත් සම් භාණ්ඩ .. | 21 | 3,434 | 1,810 | — | — | — |
| 7. හකුරු හා උක් නිෂ්පාදන | 7 | 298 | 179 | 1 | 55 | 33 |
| 8. ගෘහ භාණ්ඩ හා අනෙකුත් දැව නිෂ්පාදන | 87 | 9,255 | 5,248 | 5 | 743 | 446 |
| 9. කොහු හා කොහු ආශ්‍රිත අනෙකුත් නිෂ්පාදන .. | 99 | 9,638 | 5,763 | 3 | 570 | 342 |
| 10. ලිපි ද්‍රව්‍ය හා අනෙකුත් කඩදාසි නිෂ්පාදන .. | 25 | 4,121 | 2,273 | 1 | 25 | 15 |
| 11. ආහාර සහ පාන වර්ග .. | 86 | 17,532 | 8,901 | 8 | 910 | 546 |
| 12. තීන්ත, පොලිෂ්, වාර්නිස් ආදිය .. | 10 | 3,677 | 1,871 | — | — | — |
| 13. ගුවන් විදුලි යන්ත්‍ර සහ පාපැදි සඳහා අමතර කොටස් .. | 13 | 1,733 | 1,015 | 1 | 225 | 135 |
| 14. සබන් සහ අනෙකුත් සුවඳ විලවුන් වර්ග .. | 28 | 1,281 | 768 | — | — | — |
| 15. හස්ත කර්මාන්ත සහ සෙල්ලම් බඩු .. | 20 | 808 | 485 | — | — | — |
| 16. සුරුට්ටු සහ බීඩි .. | 6 | 48 | 29 | — | — | — |
| 17. ධීවර යාත්‍රා හා මිරිදිය ධීවර කටයුතු .. | 8 | 5,400 | 2,300 | 1 | 1,000 | 400 |
| 18. ස්වර්ණාභරණ හා මැණික් .. | 12 | 806 | 484 | 1 | 150 | 90 |
| 19. ක්‍රීඩා භාණ්ඩ .. | 3 | 94 | 56 | — | — | — |
| 20. කෘෂි උපකරණ .. | 9 | 1,702 | 821 | — | — | — |
| 21. වීදුරු හා වෙනත් වීදුරු නිෂ්පාදන .. | 7 | 1,166 | 700 | — | — | — |
| 22. පිත්තල සහ ඇලුමිනියම් භාණ්ඩ .. | 49 | 7,784 | 3,930 | 2 | 1,070 | 448 |
| 23. ලී ඉරීම .. | 49 | 10,051 | 6,008 | 2 | 875 | 510 |
| 24. මුද්‍රණ කටයුතු .. | 46 | 13,193 | 7,239 | 6 | 2,250 | 1,350 |
| 25. විවිධ .. | 106 | 24,510 | 13,115 | 11 | 2,965 | 1,579 |
| එකතුව .. | 1,657 | 2,82,278 | 1,55,477 | 72 | 17,492 | 9,617 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

**සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත (සුමක II) ණය සහතික ක්‍රමය**

ජාත්‍යන්තර සංවර්ධන සංගමයෙන් ලැබූ එ.ජ. ඩොලර් 3 කෝටියකින් දෙවැනි සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ණය සහතික ක්‍රමය ( සුමක II) 1982 දී ආරම්භ කරනු ලැබීය. 1983 හා 1984 වර්ෂවලදී සුමක ණය උපයෝගී කර ගත් ප්‍රමාණය අසතුටුදායක වූ අතර, 1984 දෙසැම්බර් වනවිට ගෙන තිබූ මුළු ණය ප්‍රමාණය (ජාතික සංවර්ධන බැංකුව විසින් ප්‍රතිමූල්‍යනය කරන ලද සියයට 80 ක ණය ප්‍රමාණය) රුපියල් 13 කෝටි 33 ලක්ෂයක් විය.

සුමක II යටතේ සහභාගිවූ ණය දෙන ආයතන විසින් දෙනු ලැබූ රුපියල් 14 කෝටි 10 ලක්ෂයක ණය වෙනුවෙන් මහ බැංකුව ණය සහතික 372 ක් නිකුත් කර තිබුණි. සහතික කරනු ලැබූ ණය අතුරින් ණය දීම් 58 ක් මේ වන විටත් හිඟ හිටුවා තිබුණි. හිමිකම් පෑම් 3 ක් බැංකුවලින් ඉදිරිපත් කර තිබූ අතර, ඒවා 1984 දෙසැම්බරයේදී බේරුම් කිරීමට නියමිතව තිබුණි. සුමක II යටතේ දෙන ලද ණය, කර්මාන්ත අනුව වර්ග කොට 2.5 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

**2 . 5 සංඛ්‍යා සටහන**

**සුමක II යෝජනා ක්‍රමය – කර්මාන්ත අනුව ණය වර්ගීකරණය**

රුපියල් '000

| කර්මාන්තය | 1982 – 1984 | | | 1984 | | |
|---|---|---|---|---|---|---|
| | ණය මුදල් සංඛ්‍යාව | අනුමත කළ ප්‍රමාණය | ඇප වූ ප්‍රමාණය | ණය මුදල් සංඛ්‍යාව | අනුමත කළ ප්‍රමාණය | ඇප වූ ප්‍රමාණය |
| 1. ආහාර සකස් කිරීම .. | 100 | 36,690 | 19,874 | 48 | 25,523 | 13,574 |
| 2. වෙනත් කෘෂි නිෂ්පාදන .. | 12 | 6,614 | 3,249 | 7 | 6,025 | 2,896 |
| 3. රබර් නිෂ්පාදන .. | 15 | 7,897 | 3,968 | 12 | 7,297 | 3,608 |
| 4. ලෝහ නිෂ්පාදන .. | 54 | 11,936 | 7,207 | 21 | 7,514 | 4,564 |
| 5. ගොඩනැගිලි ද්‍රව්‍ය .. | 26 | 11,720 | 6,652 | 22 | 10,965 | 6,199 |
| 6. ඉදිකිරීමේ කොන්ත්‍රාත්තු .. | — | — | — | — | — | — |
| 7. දැව නිෂ්පාදන .. | 38 | 9,742 | 5,845 | 21 | 5,211 | 3,126 |
| 8. මසා නිමකළ ඇඳුම් .. | 29 | 13,525 | 7,098 | 16 | 7,764 | 4,042 |
| 9. රෙදිපිළි .. | 12 | 4,970 | 2,982 | 10 | 4,615 | 2,769 |
| 10. අළුත් වැඩියා කිරීමේ වැඩ පලවල් .. | 6 | 1,525 | 915 | 5 | 1,495 | 897 |
| 11. වෙනත් .. | 80 | 36,365 | 19,663 | 50 | 26,541 | 14,268 |
| එකතුව | 372 (අ) | 1,40,984 | 77,453 | 212 | 1,02,950 | 55,943 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) 1983 දී සහතික කරන ලදුව, 1984 වසරේදී සුමක 1 ට මාරු කරන ලද, රුපියල් ලක්ෂ 59 ක් වූ ණය 25 ක් නැත.

**ග්‍රාමීය ණය**

බැංකු ක්‍රමයේ ග්‍රාමීය ණය කටයුතු ක්‍රියාත්මක කිරීම මෙහෙයවීමෙන් සහ අනුබල දීමෙන්, 1984 වර්ෂයේදීත් ක්‍රියාශීලී කාර්ය භාරයක්, මහ බැංකුව නොකඩවා ඉටු කළේය. ග්‍රාමීය ණය දීම්වලට අදාළ ප්‍රතිපත්ති සකස් කිරීමේ කාර්යයන්හිලා මහ බැංකුව ක්‍රියාශීලීව සම්බන්ධ විය.

මේ වර්ෂය තුළදී, බැංකුව මැදිහත් වූ අතිශයින් වැදගත් කාර්යය වූයේ, රට තුළ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු (ප්‍රා. ග්‍රා. සං. බැ.) පිහිටුවීමට කර ඇති යෝජනාව සම්බන්ධයෙන් ව්‍යවස්ථා සම්පාදනය කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීමට අදාළ කටයුතුවල නිරත වීමය. යෝජිත කෙටුම්පත වර්ෂය මැද වන විට සූදානම් කළ අතර, කැබිනට් අනුමැතිය ද ලැබුණි.

මේ යෝජනා, අනුමැතිය ලබා ගැනීම සඳහා 1985 මුල් කාලයේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ඇතැයි බලාපොරොත්තු වනු ලැබේ. මේ අනුව, එකී යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සකස් කිරීමට මහ බැංකුව පියවර ගත්තා ලදී. ඒ හා සමගම, අනු කමිටුවක් මඟින් සේවකයින් බඳවා ගැනීමේ ප්‍රතිපත්ති, වැටුප් හා අනෙකුත් ගෙවීම්, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු පිහිටුවිය යුතු ස්ථාන හා ඒවා මගින් ග්‍රාමීය ණය දීමේදී අනුගමනය කළ යුතු නව ක්‍රම, ආදිය ගැන පරීක්ෂා කර බලා වාර්තාවක් ඉදිරිපත් කරන ලදී.

1984 දී, ග්‍රාමීය ණය උපදේශක මණ්ඩලය (ග්‍රා.ණ.උ.ම.) හත් වතාවක් රැස්විය. ග්‍රාමීය ණය ක්ෂේත්‍රයේ ප්‍රධාන ප්‍රතිපත්ති සම්පාදක ආයතනය මෙය විය. මෙම රැස්වීම්වලදී ග්‍රාමීය අංශය කෙරෙහි තීරණාත්මක අන්දමින් බලපාන්නාවූ කරුණු කීපයක්ම සාකච්ඡාවට භාජනය කරන ලදී. තවද, දැනට ඇති ණය යෝජනා ක්‍රම යටතෙහිලා මෙතෙක් ණය ලබා නොදුන් අවශ්‍යතාවයනට ණය සැළසීම සඳහා යෝජනා කීපයක් ද සළකා බලන ලදී. ග්‍රාමීය ණය උපදේශක මණ්ඩලයේ පරීක්ෂාවට භාජනය වූ යෝජනාවලින් ප්‍රධාන ඒවා කීපයක් නම්, ධීවර අංශයේ බැංකු මූල්‍යකරණ යෝජනා ක්‍රමය යටතේ දෙන ලද ණය නැවත ලේඛනගත කිරීම, පොළොන්නරුවේ වී ගොවිතැන් කරන්නන්ට පරිභ්‍රමණ ණය ක්‍රමය හඳුන්වා දීම, තෙත් කලාපීය ප්‍රදේශවලට ගොවිතැන් සඳහා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ලබා ගැනීම සඳහා ප්‍රතිමූල්‍ය පහසුකම් සැළසීම හා සකසුරුවම් සහ සමුපකාර සමිති මඟින් කෘෂි ණය ව්‍යාප්ත කිරීමද විය. මේවායින් සමහර යෝජනා දැනටමත් ක්‍රියාත්මක කොට ඇති අතර, තවත් සමහරක් නුදුරු අනාගතයේ දී ක්‍රියාත්මක කරනවා ඇත.

මහ බැංකුවේ මැදි හා දීර්ඝකාලීන ණය ක්‍රමයේ කාණ්ඩ I යටතේ ඇති ණය ක්‍රමවල ප්‍රගතිය 2.6 සංඛ්‍යා සටහනින් දැක්වේ. 1984 වර්ෂයේ මෙකී ණය ක්‍රම 27 ක් ක්‍රියාත්මක වෙමින් පැවති අතර, ඒවායින් පහක් වර්ෂය තුළ හඳුන්වා දෙන ලද ඒවා විය.

කලින් වර්ෂයේ මෙන්ම, ණය ප්‍රයෝජනයට ගැනීම අතින් ප්‍රමාණවත් ප්‍රගතියක් නොලත් යෝජනා ක්‍රම සැළකිය යුතු ප්‍රමාණයක් විය. මහ බැංකුව විසින් මෙකී යෝජනා ක්‍රම සඳහා ප්‍රතිමූල්‍ය පහසුකම් සළසනුවස් රුපියල් 88 කෝටි 22 ලක්ෂයක් වෙන්කර තැබූ නමුත්, වර්ෂය අවසානයේදී එයින් ප්‍රයෝජනයට ගෙන තිබුනේ රුපියල් 31 කෝටි 33 ලක්ෂයක් හෙවත් සියයට 36 ක් පමණි. මෙම අසතුටුදායක තත්ත්වය සඳහා වන වගකීම හුදෙක් ණය දෙන බැංකු මතම පැවරිය නොහැකිය. වාණිජ බැංකුවල පාලන පථයෙන් පරිබාහිරව මෙම යෝජනා ක්‍රම කෙරෙහි බලපෑ සාධක බොහෝ විය. දිස්ත්‍රික්ක ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති යටතේ මූල්‍යකරණය රඳා පවතිනුයේ අනෙකුත් විධායක ආයතන ලබා ගත්තා වූ ප්‍රගතිය මතය. නියමිත කාලය තුළදී මූලික වැඩ කටයුතු නිම කිරීමට සමාගමට නොහැකි වූ නිසා පැල්වත්ත ව්‍යාපෘතිය යටතේ උක් වැවීම සඳහා මුදල් සැපයීමේ කටයුතු ආරම්භ කිරීමට නොහැකි විය. එසේම, ඇතැම් ණය ක්‍රමවල පැවති ක්‍රියාත්මක කරවීමේ අඩුපාඩුකම් නිසාද ණය සැපයීමට අපහසු විය. බර අදින සතුන් හා රෝද හතරේ ට්‍රැක්ටර් සඳහා ඉල්ලුමක් නොමැති වීම මේ සම්බන්ධයෙන් බැංකු විසින් සතුටුදායක ලෙස ණය සැපයීම කළ නොහැකි වීමට ප්‍රධාන හේතුව විය.

අනෙක් අතට, නිරතුරු ඉල්ලුමක් පැවති රෝද දෙකේ ට්‍රැක්ටර් මිළදී ගැනීම සඳහා ණය සැපයීම, සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ, අදාළ ණය ක්‍රමය යටතේ සතුටුදායක ලෙස සිදුවිය. අවශ්‍ය කරන්නාවූ යටිතල පහසුකම්, පුහුණු ශ්‍රමය හා වාණිජ බැංකු නිලධාරීන්ගේ ක්‍රියාවලිය 1984 දී බොහෝ ණය ක්‍රමවල ප්‍රගතිය අඩාල වීමට බොහෝ සෙයින් හේතු සාධක විය.

මැදි හා දිගු කාලීන ණය අරමුදලේ
සඳහා අනුමත කරන ලද

| ණය යෝජනා ක්‍රමයේ නම | වෙන්කරන ලද ප්‍රතිමූල්‍ය (රු. දශ ලක්ෂ) |
|---|---|
| **(අ) 1984 වර්ෂය ආරම්භයේදී තිබූ ණය යෝජනා ක්‍රම** | |
| 1. උඩවැඩියා වගාව සඳහා ණය යෝජනා ක්‍රමය ලංකා බැංකුව/සීමාසහිත ලංකා දුම්කොළ සමාගම .. | 4·50 |
| 2. පොල් පොහොර ණය යෝජනා ක්‍රමය .. .. | 45·20 |
| 3. ධීවර අංශය සඳහා බැංකු ණය යෝජනා ක්‍රමය .. .. | 140·00 |
| 4. වැව්, ධාරිමාර්ග නවීකරණ යෝජනා ක්‍රමය .. .. | 7·69 |
| 5. නුවරඑළිය දිස්ත්‍රික්කයේ කිරිපට්ටි පාලන සංවර්ධන ණය යෝජනා ක්‍රමය | 10·00 |
| 6. කුරුණෑගල දිස්ත්‍රික් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ ගොවිපල යන්ත්‍ර උපකරණ සඳහා වන ණය යෝජනා ක්‍රමය .. | 40·00 |
| 7. සමන්තුරේ මැතිවරණ කොට්ඨාශය තුළ කිරිපට්ටි පාලන සංවර්ධන (නියමු) ණය යෝජනා ක්‍රමය .. .. | 0·12 |
| 8. මහවැලි සංවර්ධන ව්‍යාපාරය තුළ පදිංචිකරුවන්ට ට්‍රැක්ටර් මිළදී ගැනීම සඳහා වන ණය යෝජනා ක්‍රමය .. .. | 55·00 |
| 9. විවිධ සේවා සමුපකාර සමිති විසින් ඉදිකරන පොහොර ගබඩා සඳහා ණය යෝජනා ක්‍රමය .. .. .. | 14·00 |
| 10. වයඹ දිග වෙරළේ ධීවර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා අබුඩාබි රජයෙන් ආධාර ලබන ණය යෝජනා ක්‍රමය .. .. | 60·00 |
| 11. උඩවැඩියා වගාව සඳහා වන ණය යෝජනා ක්‍රමය මහජන බැංකුව/ සර්වෝදය / ලක්මල්සල .. .. .. | 3·00 |
| 12. ධීවර සමුපකාර සඳහා ණය යෝජනා ක්‍රමය .. .. | 42·00 |
| 13. මාතලේ/පුත්තලම දිස්ත්‍රික් ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන යෝජනා ක්‍රමය .. | 54·23 |
| 14. සුළංබල යන්ත්‍ර සඳහා මූල්‍ය පහසුකම් සැපයීමේ ණය යෝජනා ක්‍රමය.. | 2·56 |
| 15. මාතර දිස්ත්‍රික්කයේ තරුණ තරුණියන් සඳහා ස්වයං රැකියා යෝජනා ක්‍රමය .. .. | 8·20 |
| 16. රදම්පොල උඩ අපරක්ක ගම් නගා සිටුවීමේ ව්‍යාපාරය .. | — |
| 17. ශ්‍රී ලංකා ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය .. .. | 137·00 |
| 18. කුඩා තේ ඉඩම් හිමියන් සඳහා වන පොහොර ණය යෝජනා ක්‍රමය .. | 7·50 |
| 19. ශ්‍රී ලංකා ග්‍රාමීය ණය යෝජනා ක්‍රමයෙන් ආවරණය නොවන දිස්ත්‍රික්ක සඳහා බර අදින සතුන් මිළදී ගැනීම සඳහා මූල්‍ය පහසුකම් සැපයීමේ ණය යෝජනා ක්‍රමය .. .. .. | 5·60 |
| 20. ගම් නගා සිටවීම හා ස්වයං රැකියා වැඩ පිළිවෙල යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ තෝරා ගන්නා ලද ව්‍යාපෘති සඳහා මූල්‍ය පහසුකම් සැපයීමේ ණය යෝජනා ක්‍රමය .. .. .. | 6·00 |
| 21. ගොවිපලවල පවත්වාගෙන යනු ලබන කුඩා පරිමාණයේ බීජ අර්තාපල් ගබඩා ඉදිකිරීම සඳහා ණය යෝජනා ක්‍රමය .. .. | 1·00 |
| 22. බදුල්ල දිස්ත්‍රික්කයේ ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන යෝජනා ක්‍රමය .. | 7·00 |
| **(ආ) 1984 වර්ෂය තුළදී අනුමත කරන ලද ණය යෝජනා ක්‍රම** | |
| 1. මාදැල් මගින් මසුන් ඇල්ලීමේ ණය යෝජනා ක්‍රමය (වෙරළේ සිට දැල් ඇදීම) .. | 5·00 |
| 2. පැල්වත්ත සීනි ව්‍යාපෘතිය යටතේ උක් වවන්නන් සඳහා ඇති ණය ක්‍රමය | 66·00 |
| 3. වවුනියා-මන්නාරම දිස්ත්‍රික්ක ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩ පිළිවෙල.. | 32·00 |
| 4. සෙවනගල, හිඟුරාණ සහ කන්තලේ සීනි ව්‍යාපෘති යටතේ උක් වගාකරන්නන් සඳහා ඇති ණය යෝජනා ක්‍රමය .. .. | 120·60 |
| 5. රඹුක්කන ප්‍රදේශයේ පොල් වවන්නන්ට අතුරු වගාව හා නැවත වගාව සඳහා දෙනු ලබන ශ්‍රී ලංකා / ආ. සං. බැ. පොල් සංවර්ධන ව්‍යාපෘති ණය යෝජනා ක්‍රමය .. .. .. | 8·00 |
| එකතුව .. | 882·20 |

1 වැනි කාණ්ඩය සටහන් ප්‍රතිමූල්‍යකය

ණය ක්‍රම

| 84.12.31 දින වන විට එයින් ප්‍රයෝජනයට ගෙන ඇති ප්‍රමාණය (රු. දශ ලක්ෂ) | 84.12.31 දින වන විට එයින් ප්‍රයෝජනයට නොගෙන තිබූ ප්‍රමාණය (රු. දශ ලක්ෂ) | ව්‍යාපෘතිය ආරම්භ කළ දිනය | වෙන්කරන ලද ප්‍රතිමූල්‍ය ප්‍රයෝජනයට ගතහැකි කාලය (අවුරුදු) |
|---|---|---|---|
| 3·49 | 1·01 | 03.02·79 | 3 |
| 39·23 | 5·97 | 26·03·79 | 3 |
| 126·29 | 13·71 | 02·07·79 | 3 |
| 7·69 | — | 02·06·79 | 1 |
| 8·10 | 1·90 | 22·08·79 | 3 |
| 33·79 | 6·21 | 28·10·79 | 5 |
| — | 0·12 | 27·11·79 | 3 |
| 5·40 | 49·60 | 19·11·79 | 3 |
| 8·81 | 5·19 | 13·10·80 | 1 |
| — | 60·00 | 13·10·80 | 3 |
| 0·23 | 2·77 | 10·12·80 | 5 |
| — | 42·00 | 28·04·81 | 2 |
| 17·90 | 36·33 | 08·05·81 | 6 |
| 1·05 | 1·51 | 11·12·81 | 1 |
| 2·18 | 6·02 | 10·04·81 | — |
| — | — | 16·03·81 | — |
| 52·54 | 84·46 | 01·07·82 | 1 |
| 4·37 | 3·13 | 11·08·82 | 1 |
| 0·01 | 5·59 | 10·09·82 | 2 |
| 1·27 | 4·73 | 14·10·82 | 2 |
| — | 1·00 | 01·03·83 | 1 |
| 1·00 | 6·00 | 27·09·83 | 5 |
| — | 5·00 | 26·04·84 | 1 |
| — | 66·00 | 10·05·84 | 6 |
| — | 32·00 | 14·06·84 | 4 |
| — | 120·60 | 20·09·84 | 5 |
| — | 8·00 | 26·12·84 | 3 |
| 313·35 | 568·85 | — | — |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

ශ්‍රී ලංකා මහ බැංකුවේ සම්බන්ධීකරණය ඇතිව, ආසියානු සංවර්ධන බැංකුවේ ආධාරය ලැබූ ශ්‍රී ලංකා ග්‍රාමීය ණය ව්‍යාපෘතිය, ණය දීමෙහිලා සතුටුදායක ප්‍රගතියක් පෙන්වීය. ව්‍යාපෘතියේ ගොවිපොළ යන්ත්‍රෝපකරණ සම්බන්ධයෙන් ගත් කල, සිය ඉලක්කය වූ රෝද දෙකේ ට්‍රැක්ටර් 1,000 ක් ගොවීන්ට සාර්ථක ලෙස විකිණීමෙන් අනතුරුව, ප්‍රධාන සම්පාදිත ආයතන දෙක වන ලංකා බැංකුව හා මහජන බැංකුව තවත් එවැනි ට්‍රැක්ටර් 1,000 ක් ලබා ගැනීම පිණිස 1984 දී ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (ට්‍රැක්ටර්) නීතිගත සංස්ථාව සමග දෙවැනි ගිවිසුමකට අත්සන් තැබීය. මුළු දිවයිනම ඇතුළත් වන පරිදි බල ප්‍රදේශය ව්‍යාප්ත කිරීමෙන් අනතුරුව, රෝද හතරේ ට්‍රැක්ටර් අලෙවිය සම්බන්ධයෙන් මුහුණපෑ දුෂ්කරතා තරමක් දුරට මග හැරිණ. වතුර පොම්ප සහ බල ශක්තියෙන් ක්‍රියාකරන තෙල් ඉසින උපකරණ අලෙවිය වර්ෂය තුළ දී සැහෙන දියුණුවක් ලබා ඇත. වාරිමාර්ග සම්බන්ධයෙන් එහි ක්‍රියාකාරී ආයතනය වන ජල සම්පත් මණ්ඩලය අවශ්‍ය උපකරණ ලබා ගැනීම පිළිබඳව සැහෙන ප්‍රගතියක් ලබා තිබේ. ව්‍යාපෘතියේ කටයුතු, ණය නිම වන දිනය වන 1985 දෙසැම්බර් 31 වැනි දිනට පෙර අවසන් කරනු වස්, ණය කොටස් නැවත බෙද වෙන් කිරීමට, 1984 මැයි මාසයේදී ශ්‍රී ලංකාවට පැමිණි ආසියානු සංවර්ධන බැංකුවේ නියෝජිත පිරිස විසින් නිර්දේශ කරන ලදී.

වාණිජ බැංකු ශාඛා 18 ක, (මහජන බැංකුවේ ශාඛා අට හා ලංකා බැංකුවේ ශාඛා දහය) කෘෂි ණය කටයුතු ද, අම්පාර, පුත්තලම, මාතලේ, නුවරඑළිය, බදුල්ල, මහනුවර හා කළුතර යන දිස්ත්‍රික්කවල පිහිටි සමුපකාර ග්‍රාමීය බැංකු තුනක වැඩ කටයුතු ද, පරීක්ෂා කිරීම, 1984 වර්ෂයේදී මහ බැංකුව විසින් නිම කරන ලදී. එකී අඩුපාඩුකම් හරිගස්සා ගැනීම සඳහා කරන ලද නිර්දේශ ද සහිතව, පරීක්ෂණ වාර්තා, ඒ ඒ බැංකු ශාඛාවලට යවන ලද අතර, එම නිර්දේශ ක්‍රියාත්මක කළ බවට මහ බැංකුවට වාර්තා කරන ලෙසට ඉල්ලීමක් ද කර තිබුණි.

## ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය

වාණිජ බැංකු, වෙනත් මූල්‍යායතන හා සමුපකාර සමිතිවල මැදි හා ජ්‍යෙෂ්ඨ කළමණාකරන නිලධාරීන් 636 දෙනෙකු සහභාගිවූ පුහුණු පාඨමාලා, සම්මන්ත්‍රණ හා වැඩ මුළු විසිහයක් ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය විසින් සංවිධානය කොට පවත්වන ලදී. කොළඹ පිහිටි ග්‍රින්ඩ්ලේස් බැංකුවේ අනුග්‍රහය ලද ණය කළමණාකරනය පිළිබඳ වැඩ සටහන, ඉන්දියාවේ බොම්බායේ පිහිටි ග්‍රින්ඩ්ලේස් ජාත්‍යන්තර අභ්‍යාස ආයතන අධිකාරිය විසින් පවත්වනු ලැබූ අතර, කළමණාකරන නිපුණත්වයන් වැඩි දියුණු කිරීම පිළිබඳ පාඨමාලාව පැවැත්වූයේ කොළඹ පිහිටි සිටි බැන්ක්හි අනුග්‍රහයෙනි.

1984 දී අභ්‍යාස ආයතනය විසින් ඉදිරිපත් කරන ලද පාඨමාලාවන්, ණය කළමණාකරනය, ව්‍යාපෘති හඳුනා ගැනීම සහ අගැයීම, වාණිජ බැංකු කටයුතු, කළමණාකරන සංවර්ධනය, බැංකු කටයුතු පරිගණක යන්ත්‍ර ගත කිරීම, ගෘහ කර්මාන්ත, සංඛ්‍යාන සහ ගණකාධිකරණය යනාදී ක්ෂේත්‍රයන්ට අදාළ විය. ග්‍රාමීය බැංකු කටයුතු හා ණය කටයුතු පිළිබඳව නිලධාරීන් පුහුණු කිරීම, පුහුණු කිරීමේ වැඩ සටහන් වලදී ප්‍රමුඛස්ථානයෙහි ලා සලකන ලදී. පිට පළාත්වල පවා පුහුණු කිරීමේ වැඩ සටහන් පවත්වනු ලැබීය.

1984 සැප්තැම්බර් මසදී විද්‍යාලයීය තුන්වැනි සාංවත්සරික දේශනය, මුදල් මණ්ඩලයේ සාමාජික එන්. ජී. පී. පණ්ඩිතරත්න මහතා විසින් 'මහවැලි කලාපයේ ණය අවශ්‍යතාවයන්' යන මාතෘකාව යටතේ පවත්වන ලදී.

## සේවක අර්ථ සාධක අරමුදල්

සේවක අර්ථ සාධක අරමුදල් දායක දීමනා හා අධිභාර මුදල් ලබා දෙන අරමුදලේ මුදල් ආයෝජනය කිරීම, අරමුදලේ ලියා පදිංචි සේවායන්ගේ හා කේවල සාමාජික ගිණුම් ක්‍රමානුකූල ලෙස පවත්වාගෙන යාම සහ ප්‍රතිලාභ මුදල් සාමාජිකයින් වෙත ආපසු ගෙවීමේ

වගකීමද සේ.අ.අ. පනතේ විධිවිධානයන් ප්‍රකාර මහ බැංකුවේ මුදල් මණ්ඩලයට පැවරී ඇත. මෙකී කාර්ය භාරයන් ඉටුකිරීමේදී බැංකුවේ සේවක අර්ථ සාධක අරමුදල් දෙපාර්තමේන්තුව, පනතේ විධිවිධානයන් ක්‍රියාත්මක කිරීම හා පරිපාලනමය කටයුතු පිළිබඳ වගකීම පැවරී ඇති කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක අර්ථ සාධක අරමුදල් අංශය සමග කිට්ටු සහයෝගීතාවයකින් කටයුතු කරනු ලැබේ. 1984 වර්ෂය තුළ එහි මෙහෙයවුම් කටයුතු පිළිබඳ සංක්ෂිප්ත සටහනක් පහත දක්වා ඇත.

**දායක මුදල්**

1984 වර්ෂය තුළදී අරමුදලට ලැබුන දායක දීමනා රුපියල් 158 කෝටි 34 ලක්ෂයක් වූ අතර, 1983 වර්ෂයේදී එය රුපියල් 120 කෝටි 17 ලක්ෂයක් විය. මෙය කලින් වර්ෂය තුළ ලැබුණු දායක දීමනා මට්ටමට වඩා රුපියල් 38 කෝටි 17 ලක්ෂයක නැතහොත් සියයට 31.8 ක වැඩි වීමකි. 1978 වර්ෂයෙන් පසු වාර්තාගත වී ඇති ඉහළම ප්‍රතිශත වැඩිවීම මෙය වේ.

**සාමාජිකයන්ගේ ශේෂ**

සමාලෝචිත වර්ෂය සඳහා පොළී වෙන්කිරීමට පෙර, 1984 දෙසැම්බර් 31 වැනි දිනට සාමාජිකයින්ගේ ශේෂයන් රුපියල් 1,039 කෝටි 28 ලක්ෂයක්ව පැවතුණි. මෙය 1983 වර්ෂයේ මට්ටමට වඩා රුපියල් 205 කෝටි 9 ලක්ෂයක නැතහොත් සියයට 24.6 ක වැඩිවීමකි.

**ආයෝජන**

අරමුදල විසින් සමාලෝචිත වර්ෂය තුළදී රජයේ සුරකුම්පත්, භාණ්ඩාගාර බිල්පත් සහ නාගරික සංවර්ධන අධිකාරිය හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව මගින් නිකුත් කැරුණ ණයකරවල රුපියල් 589 කෝටි 56 ලක්ෂයක මුදලක් ආයෝජනය කරන ලදී. 1983 වර්ෂයේදී මේ අන්දමින් ආයෝජනය කළ මුදල රුපියල් 238 කෝටි 90 ලක්ෂයක් විය. 1983 වර්ෂයේ මට්ටමට වඩා මෙය රුපියල් 350 කෝටි 66 ලක්ෂයක වැඩිවීමකි. සමාලෝචිත වර්ෂය තුළදී කැරුණ මුළු ආයෝජන ප්‍රමාණයට, කලින් කරනු ලැබූ ආයෝජන හා භාණ්ඩාගාර බිල්පත්වල කල් පිරුණු ප්‍රේෂණ ඵලයන් නියෝජනය කෙරෙන රුපියල් 371 කෝටි 77 ලක්ෂයක්ද ඇතුළත් විය. රජයේ සුරකුම්පත්වල පමණක් ආයෝජනය කරනු ලැබූ මුදල රුපියල් 315 කෝටි 23 ලක්ෂයක් විය. මෙය ශ්‍රී ලංකා රජය විසින් 1984 වර්ෂය තුළ නිකුත් කැරුණ මුළු සුරකුම්පත් ප්‍රමාණයෙන් සියයට 72.6 ක් නියෝජනය කෙරේ. වර්ෂය තුළ වරින් වර භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය කළ මුළු මුදල් ප්‍රමාණය රුපියල් 247 කෝටි 29 ලක්ෂයක් විය. සමාලෝචිත වර්ෂය අවසන් වනවිට භාණ්ඩාගාර බිල්පත් කිසිවක් අරමුදල සතුව නොතිබූ අතර, සියළුම භාණ්ඩාගාර බිල්පත් ඊට ප්‍රථම වට්ටම් කර තිබුණි. 1984 දෙසැම්බර් 31 වැනි දිනට අරමුදල සතුව තිබූ මුළු ආයෝජන ප්‍රමාණය රුපියල් 1,113 කෝටි 47 ලක්ෂයක් විය. මෙය 1983 පැවති මට්ටමට වඩා රුපියල් 217 කෝටි 80 ලක්ෂයක වැඩි වීමකි.

**ආයෝජනයන්ගෙන් ලැබූ ආදායම**

1984 වර්ෂයේදී අරමුදලේ ආයෝජනයන්ගෙන් ලැබූ ආදායම රුපියල් 119 කෝටි 39 ලක්ෂයක් වූ අතර, 1983 වර්ෂයේදී එය රුපියල් 92 කෝටි 34 ලක්ෂයක් විය. මෙය රුපියල් 27 කෝටි 5 ලක්ෂයක නැතහොත් සියයට 29.3 ක වැඩිවීමකි. මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ අරමුදල වෙත ලැබුණු දායක මුදල් ප්‍රමාණයේ වැඩිවීම සහ සමාලෝචිත වර්ෂය තුළදී කලින් ආයෝජන වලින් ලැබුණු ආදායම ප්‍රති ආයෝජනය කිරීම ද වේ.

**ප්‍රතිලාභ ගෙවීම්**

1984 වර්ෂයේදී සාමාජිකයින්ට සේ.අ.අ. ප්‍රතිලාභ වශයෙන් ආපසු ගෙවන ලද මුදල රුපියල් 55 කෝටි 16 ලක්ෂයක්වූ අතර, 1983 වර්ෂයේ එය රුපියල් 38 කෝටි 36 ලක්ෂයක් විය. මෙය රුපියල් 16 කෝටි 80 ලක්ෂයක නැතහොත් සියයට 43.8 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. සමාලෝචිත වර්ෂය තුළ දෙපාර්තමේන්තුව වෙත ලැබුණු ප්‍රතිලාභ ආපසු ගෙවීම සඳහා වූ

හිමිකම් පෑම් සංඛ්‍යාව 75,281 ක් විය. මෙයින් 8,314 ක් ඉන්දියානු සම්භවය ඇති පෙරළා සිය රට යන්නවුන්ගෙන් සහ 40,278 ක් වෛද්‍ය හේතූන් මත හිමිකම් පෑ අයගෙන්ද විය. වර්ෂය තුළදී ආපසු ගෙවනු ලැබූ හිමිකම්පෑම් සංඛ්‍යාව 65,198 ක් විය.

**සාමාජිකයන්ගේ ශේෂයන් මත පොළිය**

සේවක අර්ථ සාධක අරමුදල විසින් එක් එක් වර්ෂය අවසානයට ඇති සාමාජිකයින්ගේ ශේෂයන් මත, අරමුදලේ ආයෝජනයන්ගෙන් ලැබෙන ආදායමෙන් පොළී ගෙවිය යුතු වේ. 1983 වර්ෂය අවසානයට සාමාජිකයින්ගේ ශේෂයන් මත ගෙවිය යුතු පොළිය වර්ෂයකට සියයට 12 ක් ලෙස 1984 වර්ෂයේ දී වැඩි කරන ලදී. වර්ෂය අවසානයේ සාමාජිකයින්ගේ බැරට ඇති ශේෂයන් මත පොළිය ගෙවනු ලබන අතර, ඊට පසුව එක්වන මුදලට ද පොළිය රාශිකෘත වේ. තවද වර්තන වර්ෂය සඳහා දායක දීමනා කිසියම් කොටසක් සාමාජිකයාගේ බැරට ලැබුන දිනය සැළකිල්ලට නොගෙන වර්ෂය අවසානයේදී සාමාජිකයාගේ බැරට ඇති ශේෂය සඳහා සම්පූර්ණ වර්ෂයටම පොළිය ගෙවනු ලැබේ. උදාහරණයක් වශයෙන්, ජනවාරි මාසයේ ලැබුන දායක දීමනාවලට ගෙවනු ලබන පරිදිම එම වර්ෂයේ දෙසැම්බර් මාසයේදී ලැබෙන දායක මුදල් වෙනුවෙන්ද සම්පූර්ණ වර්ෂය සඳහාම පොළිය ගෙවනු ලැබේ. එබැවින් ක්‍රියාත්මක පොළිය දළ වශයෙන් සියයට 13.4 ක් පමණ වේ.

අරමුදලේ මෙහෙයවුම් පිළිබඳව පසුගිය වර්ෂ දෙක සඳහා දැනට ලබා ගත හැකි සංඛ්‍යා තොරතුරු මත සැකසුනු සංසන්දනාත්මක සංඛ්‍යා සටහනක් පහත දක්වා ඇත.

2 . 7 සංඛ්‍යා සටහන

**සේ. අ. අ. සංඛ්‍යාන 1983 — 1984**

රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂය | 1983 | 1984 |
|---|---|---|
| 1. ලැබූ දායක දීමනා | 1,201·7(අ) | 1,583·4(අ) |
| 2. ආයෝජන | 2,389·0(ආ) | 5,895·6(ආ) |
| 3. ආයෝජන වලින් ලද ආදායම | 923·4 | 1,193·9 |
| 4. ප්‍රතිලාභ ආපසු ගෙවීම් | 383·6 | 551·6 |
| 5. ආපසු ගෙවන ලද ප්‍රතිලාභ සංඛ්‍යාව | 55,082 | 65,198 |
| 6. පොළී අනුපාතිකය (සියයට) | 12·0 | 12·5(ඇ) |
| 7. සාමාජික ශේෂයන් මත පොළී ප්‍රතිපාදින | 1,001·0 | 1,299·0 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) අවිනිශ්චිත ගිණුමට බැර කරන ලද දායක දීමනා හැර.
(ආ) රජයේ සුරැකුම්පත්වල ප්‍රති ආයෝජනය කරන ලද කල් පිරුණු ප්‍රේෂණවල සහ කෙටිකාලීන භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනද ඇතුළුව.
(ඇ) යෝජනා කර ඇත. එහෙත් අනුමත කර නොමැත.

## විනිමය පාලන

විනිමය පාලනය ක්‍රියාත්මක කිරීම පිළිබඳව බැංකුව තවදුරටත් රජයේ නියෝජිත වශයෙන් ක්‍රියා කරන්නට යෙදුණි. විමර්ශනයට අදාළ වර්ෂය තුළදී විනිමය පාලන ක්‍රියා පිළිවෙත්වල සිදුවූ ප්‍රධාන වෙනස්කම් මෙසේය.

1. නැව් හා ගුවන් සේවා බාහිර ගිණුම්

1984 ජුනි 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැව් හා ගුවන් සේවා බාහිර ගිණුම් ආරම්භ කිරීම සඳහා විනිමය පාලකගේ අනුමැතිය අවශ්‍ය බව ප්‍රකාශයට පත් කරන ලදී.

2. අපනයන

(i) අපනයනය කරන ලද භාණ්ඩ සඳහා කරන ලද ගෙවීම්, එම භාණ්ඩ අපනයනය කළ දින සිට මාස හයක් ඉක්මවීමට පෙර ලැබිය යුතුය යන අවශ්‍යතාවය 1984 අප්‍රේල් 9 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, පහත දැක්වෙන අයුරු සංශෝධනය කරන ලදී.

(අ) ණයවර ලිපි (දුටුවන)

කල්පිරෙන දිනයේ සිට දින 21 ක් ඉකුත්වීමට පෙර ;

(ආ) ණයවර ලිපි (පමා කළ ගෙවීම) කල් පිරෙන දිනයේ සිට දින 21 ක් ඉකුත් වීමට පෙර ;

(ඇ) පමා කළ ගෙවීම් බිල්පත් (ඩී/පී) (ණයවර ලිපි රහිත දුටුවන බිල්පත්) ලිපි ලේඛන ඉදිරිපත් කළ දින සිට දින 21 ක් ඉකුත්වීමට පෙර ;

(ඈ) භාවිතිය බිල්පත් (ඩී/ඒ)

නැව්ගත කළ දින සිට දින 180 ක් ඉකුත් වීමට පෙර ;

ඉහත සඳහන් සීමාවන් ඉක්මවන ඕනෑම දීර්ඝ කිරීමක් සඳහා විනිමය පාලකගේ පූර්ව අනුමැතිය අවශ්‍ය කෙරේ.

(ii) වටිනාකම රුපියල් 5,00,000 ඉක්මවන අපනයන ලැබීම් සඳහා බලය ලත් වෙළෙන්දන් විසින් 1984 මැයි 2 වැනි දින සිට ක්‍රියාත්මක වෙන පරිදි ඉදිරි විදේශ විනිමය මිළදී ගැනීම කළ යුතු විය.

(iii) මෙක්සිකෝව හැර අනෙකුත් රටවල් වෙත කුරුඳු අපනයනය කිරීම සඳහා ආනයන සහ අපනයන පාලකගෙන් ආනයන බලපත්‍රයක් ලබා ගැනීමට තිබුණු අවශ්‍යතාවය 1984 ජූනි 6 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉවත් කරන ලදී.

(iv) වටිනාකම රුපියල් 2,500 නොඉක්මවන අගනා ගල් වර්ග සහ ආභරණ, වෙළෙඳ සැම්පලයන් ලෙස අපනයනය කිරීම සඳහා ප්‍රධාන රේගු අයකැමි හට 1984 ජුනි 7 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සිය අභිමතය පරිදි ශ්‍රී ලාංකිකයිනට අවසර දිය හැකි බව දන්වන ලදී.

3. ආනයන

(i) පත්‍ර කඩදාසි ආනයනය කිරීම සඳහා ණයවර ලිපි විවෘත කිරීම වෙනුවෙන් ආනයන සහ අපනයන පාලකගෙන් බලපත්‍රයක් ලබා ගැනීමේ අවශ්‍යතාවය 1984 ජනවාරි 10 වැනි දින සිට ඉවත් කරන ලදී.

(ii) කෝපි ආනයනය කිරීම සඳහා ණයවර ලිපියක් විවෘත කිරීමට වාණිජ අධ්‍යක්ෂගේ පූර්ව අනුමැතිය ලබා ගැනීමේ අවශ්‍යතාවය 1984 මාර්තු 23 වැනි දින සිට ඉවත් කරන ලදී. පසුව, 1984 සැප්තැම්බර් 20 වැනි දින සිට මෙම අවශ්‍යතාවය නැවත පනවන ලදී.

(iii) මෙතෙක් සියළු ආනයනයන් සඳහා ඉදිරි විනිමය විකිණීමට තිබුණු ඉඩ, 1984 මැයි 2 වැනි දා සිට ආහාර සහ ආහාර ද්‍රව්‍ය, අමු ද්‍රව්‍ය, අංගෝපාංග සහ අන්තර් භාණ්ඩ, බෙහෙත් සහ ඖෂධ වර්ග, පොත් පත්, ප්‍රාග්ධන භාණ්ඩ සහ එම අමතර කොටස් වලට සීමා කරන ලදී.

4. නේවාසික ජංගම ගිණුම්

රජය හෝ පෞද්ගලික සංවිධාන සමග කොන්ත්‍රාත් වැඩවල නියුක්ත විදේශීය සමාගම් සහ පුද්ගලයන් විසින් පවත්වාගෙන යන නේවාසික ජංගම ගිණුම්වලට පහත දක්වෙන කාරණා සම්බන්ධයෙන් කෙරෙන හර කිරීම් විනිමය පාලන දෙපාර්තමේන්තුවේ විමසීමක් නොමැතිව සිදුකළ හැකි බව බලය ලත් වෙළෙඳුන්හට දැනුම් දෙන ලදී.

(i) විදේශීය සමාගම්

බදු වැනි දේශීය වගකීම් ගෙවීමට යටත්ව රජය සහ පෞද්ගලික සංවිධාන සමග ඇතිකරගත් ගිවිසුම්වල දක්වා ඇති පරිදි දේශීය වියදම් සහ බාහිර ප්‍රේෂණ.

(ii) විදේශීය පුද්ගලයන්

දේශීය වියදම් සහ බදු වැනි දේශීය වගකීම් කිසිවක් ඇත්නම් , ඒවා නිරාකරණය කිරීමට යටත්ව එතෙර සිටින යැපෙන්නන් නඩත්තු කිරීම සඳහා පමණක් වන බාහිර ප්‍රේෂණ; අනෙකුත් සියළුම හර කිරීම් විනිමය පාලන අනුමැතිය ලබා ගැනීමට යටත් වේ.

5. අනේවාසික රුපියල් ගිණුම්

අනේවාසික ගිණුම් විවෘත කිරීම සඳහා විදේශ විනිමය මූලිකායතනයන්ගෙන් ලැබෙන අයදුම්පත් විදේශ බැංකුවකින් ලබාගත් රුපියල් දශ ලක්ෂයක ඇපයක් සහිතව ඉදිරිපත් කළ යුතු බව බලය ලත් වෙළෙඳුන්හට දැනුම් දෙන ලදී. අනේවාසික ගිණුම් අනේවාසික ආවෘත ගිණුම් ලෙස නම් කිරීම සඳහා විනිමය පාලන අනුමැතිය අවශ්‍ය බව ද සලකන ලදී.

## රාජ්‍ය ණය

මුදල් නීති පනතේ 113 වැනි වගන්තිය ප්‍රකාර, රජය වෙනුවෙන්, රාජ්‍ය ණය පරිපාලනය තවදුරටත් මහ බැංකුව විසින් කරගෙන යනු ලැබීය. රුපියල් ණය ආරම්භ කිරීම, භාණ්ඩාගාර බිල්පත් සහ බදු සංචිත සහතික පත් නිකුත් කිරීම, විදේශ ණය ලැබීම් පිළිබඳ වාර්තා තබා ගැනීම, දේශීය හා විදේශීය ණය ආපසු ගෙවීම සහ පොළී සහ බැඳීම් ගාස්තු ගෙවීම යනාදිය, මේ අනුව පැවරී ඇති ප්‍රධාන කාර්යභාරයන් විය. 1983 අංක 52 දරණ විසර්ජන පනත යටතේ, 1984 වර්ෂයේ දී රුපියල් 434 කෝටි 43 ලක්ෂයක රුපියල් ණය ආරම්භ කෙරුණි. වර්ෂයේ භාණ්ඩාගාර බිල්පත් නිකුතුව 1983 වර්ෂය අවසානයේදී පැවති මට්ටමට වඩා රුපියල් 254 කෝටියකින් අඩු විය. ඒකාබද්ධ ආයෝජන අරමුදලේ පරිපාලනය රාජ්‍ය ණය අධිකාරී විසින් තවදුරටත් කරගෙන යනු ලැබිය. එසේ වුව ද, රුපියල් ණය බෙරුම් කිරීම සඳහා රජයේ දායක දීමනා 1984 ජනවාරි මාසයේ සිට අත්හිටුවන ලදී. රාජ්‍ය ණය සඳහා 1984 මුළු පොළී ගෙවීම් ප්‍රමාණය රුපියල් 729 කෝටි 64 ලක්ෂයක් විය. නිදන් අරමුදල්වලින් කරන ලද ආපසු ගෙවීම් ඇතුළුව, ආපසු ගෙවන ලද මුළු ණය ප්‍රමාණය රුපියල් 463 කෝටි 20 ලක්ෂයක් විය. මීට අමතරව, රාජ්‍ය ණය අධිකාරී විසින් නාගරික සංවර්ධන අධිකාරිය සහ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව වෙනුවෙන් ණයකර ආරම්භ කිරීම සහ සේවා කටයුතු ද කරන ලදී. එසේම, මෙහි වෙනත් තැනක විස්තර දක්වා ඇති මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීමෙහි ද නිරත විය.

## ප්‍රාදේශීය කාර්යාලය - මාතර

1984 වර්ෂයේ ආරම්භයත් සමඟම මාතර ප්‍රාදේශීය කාර්යාලය, මාතර අනගාරික ධර්මපාල මාවතේ අංක 35 දරන තැන පිහිටි ස්වීය නව ගොඩනැගිල්ලට ගෙන යන ලදී. සුළු පරිමාණයේ ආර්ථික කටයුතුවල නිරත වූ පුද්ගලයින් විශාල පිරිසකට බැංකු ණය ලබා දීම හා වෙනත් පසු

සේවා පහසුකම් ඇති කිරීම මගින් ප්‍රාදේශීය කාර්යාලය, මෙම වර්ෂයේදීත් සිය සේවාව අඛණ්ඩව ඉටු කළේය. මෙහිදී, මූලික අවධාරණය යොමු කරන ලද්දේ ස්වයං රැකියා, ගම් නගා සිටුවීම හා වී වගා කිරීමේ ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමයන් කෙරෙහිය.

නොයෙකුත් ප්‍රතිමූල්‍ය ණය ක්‍රම යටතේ බැංකු ණය ලබා ගැනීමට ඉදිරිපත් වූ අයදුම්කරුවන් උදෙසා ව්‍යාපෘති පිළිබඳව වූ පුහුණු පාඨමාලා ගණනාවක්ම 1984 වර්ෂයේදී පැවැත්විණි. එසේ සහභාගීවූවන්ගෙන් කෘෂිකර්මය, සතුන් ඇති කිරීම හා කුඩා කර්මාන්ත පිළිබඳව 446 දෙනෙකු පුහුණු කිරීමට අමතරව, මාතර, හම්බන්තොට හා මොණරාගල යන දිස්ත්‍රික්කවල කුඹුරු සහ ගොඩ ගොවිතැන් කරන්නන්ගේ අභිවෘධිය සඳහා සාකච්ඡා හා රැස්වීම් බොහෝ ගණනක් පවත්වන ලදී.

කර්මාන්ත සංවර්ධන මණ්ඩලය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හා කෘෂි සංවර්ධන අධිකාරිය ද පුහුණු පාඨමාලා පැවැත්වීම සඳහා සිය සහාය ලබා දුනි.

මෙම කාර්යාලය මගින් 1984 අවසානය දක්වා සිදුකරන ලද ප්‍රතිමූල්‍ය ණය සැපයීමේ කටයුතු පිළිබඳ සංක්ෂිප්ත සංඛ්‍යා සටහනක් මෙහි පහත දැක්වේ.

### 2 . 8 සංඛ්‍යා සටහන

**ප්‍රතිමූල්‍ය ණය පිළිබඳ කටයුතු — ප්‍රාදේශීය කාර්යාලය, මාතර**
**සංක්ෂිප්ත සංඛ්‍යාන — 1984 අවසානයට**

| යෝජනා ක්‍රම | ප්‍රතිලාභීන් ගණන (පුද්ගලයන්) | ණය ප්‍රමාණය (රුපියල්) |
|---|---|---|
| 1. තරුණයන් 500 කගේ ස්වයං රැකියා ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමය .. | 416 | 37,24,770 |
| 2. ගම් නගා සිටුවීමේ ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමය .. | 66 | 2,49,285 |
| 3. සපිරි ග්‍රාමීය ණය ක්‍රමය යටතේ ආදර්ශ යාය වී වගා ණය .. | 962 | 22,00,000 |
| 4. සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ ගොඩ ගොවිතැන සඳහා ණය .. | 220 | 8,80,000 |
| 5. තේ පොහොර ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමය .. | 135 | 10,88,924 |
| 6. පොල් පොහොර ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමය .. | 140 | 7,66,086 |
| එකතුව .. | 1,939 | 89,09,065 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

ප්‍රතිමූල්‍ය ක්‍රමය යටතේ බැංකු ක්‍රමයේ අනුසාරයෙන් 1984 වර්ෂය අවසාන වනවිට මෙම ප්‍රදේශය තුළ ප්‍රතිලාභීන් 2,000 ක් පමණ වූ දෙනා විසින් ලබාගෙන ඇති මුළු ණය ප්‍රමාණය රුපියල් 89,09,065 ක් බව ඉහත දක්වා ඇති සංක්ෂිප්ත සංඛ්‍යා සටහනෙන් පෙන්නුම් කරයි.

1982 දී ප්‍රාදේශීය කාර්යාලය මගින් ආදර්ශ යාය වී වගා ණය ක්‍රමය හඳුන්වා දෙන විට සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ කෘෂි ණය සැපයීම සහමුලින්ම අත්හැර දමා තිබිණි. ණය ආපසු ගෙවීම් පැහැර හැරීම් අධික වීම නිසා බැංකුකරුවන් හා ගොවීන් යන දෙකොටසම සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය කෙරෙහි නොපැහැදුණි. එබැවින් ගොවීන්ගේ හා නිලධාරින්ගේ යහපත උදෙසා රැස්වීම් මාලාවක් පවත්වා ගම් මට්ටමින් අදහස් හුවමාරු කර ගැනීමට සැලැස්විය. ගම් කීපයකටම ඉන්දියානු ඕවර්සීස් බැංකුව මගින් වගා ණය සැපයීමෙන් දක්වන ලද පුරෝගාමීත්වය නිසා රාජ්‍ය බැංකුද අළුතින් ආරම්භ කළ සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ ආදර්ශ යාය වී වගා ණය දීම සඳහා දිරිමත් විය. ලංකා බැංකුව එකී යෝජනා ක්‍රමයට සිය සහාය ලබා දුන් අතර, 1984 අවසාන වනවිට, කන්න දෙකකදී වී වගාව සඳහා සපයන ලද රුපියල් දශ ලක්ෂයක් වූ ණය, සාර්ථක ලෙස ආපසු අයකර ගන්නා ලදී. දැනට

ලංකා බැංකුව සහ ඉන්දියානු ඕවර්සීස් බැංකුව විසින් මෙම යෝජනා ක්‍රමය යටතේ සපයනු ලබන කෘෂි ණය ප්‍රමාණය රුපියල් 22 ලක්ෂයක් පමණ වේ. තවත් වී වගා කරන ප්‍රදේශ මෙකී ණය ක්‍රමය යටතට ගත් කල මෙය අවුරුදු පතා ක්‍රමයෙන් වැඩි වේයැයි අපේක්ෂා කරනු ලැබේ.

හම්බන්තොට සහ මොණරාගල ආදී වියළි කලාපීය ප්‍රදේශයන්හි ගොවිතැන් කටයුතු සඳහා බැංකු ණය ලබා ගැනීම ව්‍යාප්ත කරනු වස් එහි ගොවීන්ට ගොවිපල පාලනය හා ණය දීමේ කටයුතු පිළිබඳ නවීනතම ක්‍රම ගැන අවබෝධයක් ලබා දෙනු පිණිස පසුගිය අවුරුදු දෙක තුළ සම්මන්ත්‍රණ මාලාවක් පවත්වන ලදී. යටිතල පහසුකම් නොමැතිවීම සහ ගොවීන්ගේ හා බැංකුකරුවන්ගේ ආකල්පයන් නිසා ඇති වූ ගැටළුත් හේතුකොට ගෙන බාධා ඇති වූ නමුත් ප්‍රදේශයේ ඇති නොයෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවල සහාය ලැබීම නිසා 1984 දී ණය ව්‍යාප්තිය මගින් විශාල වෙනසක් සිදු කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ගොවීන් කණ්ඩායම් කිහිපයකට වී වගාව, එළවළු හා අතිරේක බෝග වගාව, උස්සාන වාරිමාර්ග ක්‍රම හා රෝද දෙකේ ට්‍රැක්ටර් මිළදී ගැනීම ආදිය සඳහා රුපියල් 8 ලක්ෂයක් පමණ ණය ලබා ගත හැකි විය.

බුක්තිය පිළිබඳ ප්‍රශ්ණ, බලපත්‍ර ලබා ගැනීම හා ලියාපදිංචි කිරීමේ කටයුතු සම්බන්ධයෙන් අනුගමනය කළයුතු ක්‍රියාමාර්ගයන් ආදී අවහිරතා සමග බැංකු ණය ලබා ගැනීමේදී අනුගමනය කළයුතු විධි එක්ව ගත් කල මෙකී යෝජනා ක්‍රම යටතේ වෙන්කළ ප්‍රතිපාදන මුළුමනින්ම ප්‍රයෝජනයට ගැනීම කෙරෙහි බාධා ඇති කළ නමුත්, වැවිලි අංශයේ පොහොර භාවිතය වැඩි කිරීම පිණිස මහ බැංකුව මගින් ඇතිකරන ලද ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම මගින් ප්‍රදේශයේ කුඩා ඉඩම් හිමියන්ට සිදුවූයේ මහත් වාසියකි. කෙසේ වුව ද, තේ පොහොර ප්‍රතිමූල්‍ය ණය ක්‍රමය යටතේ බැංකුවලින් දෙන ලද ණය ප්‍රමාණය (ගාලු හා මාතර දිස්ත්‍රික්කවල) රුපියල් 10,88,924 ක් වූ අතර, පොල් පොහොර (මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්කවල) සඳහා එය රුපියල් 7,66,010 ක් විය.

මෙකී ප්‍රතිමූල්‍ය ණය කටයුතු සම්බන්ධයෙන් කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ, එක් එක් ව්‍යාපෘති සහ ණය වැඩ සටහන් සම්බන්ධව මනා අධීක්ෂණයක් පවත්වාගෙන යෑම හේතුකොට ගෙන ණය ආපසු ලබා ගැනීමේ අනුපාතිකය ඉහළ යාමයි. සියළුම ප්‍රතිමූල්‍ය ණය කටයුතු සම්බන්ධයෙන් සමස්ත ණය ආපසු ලබා ගැනීමේ අනුපාතිකය සියයට 85 ක් සේ ගණන් බලා ඇත.

සියයට 83 ක පමණ ණය ආපසු ගෙවීමක් වාර්තා කළ ස්වයං රැකියා හා ගම නගා සිටුවීමේ යෝජනා ක්‍රම සම්බන්ධයෙන් ණය ආපසු ගෙවීමේ තත්ත්වය 2.9 සංඛ්‍යා සටහනෙන් පැහැදිලි වෙයි. වී සහ ගොඩ ගොවිතැන ආදී වෙනත් ණය යෝජනා ක්‍රම ගැන වෙන් වශයෙන් සංඛ්‍යා සටහන්වල දක්වා නොමැති නමුත්, මේ එක් එක් අංශවල ණය ආපසු ගෙවීම සියයට 90 කටත් වඩා වැඩි බව වාර්තා වී ඇත.

ප්‍රදේශයේ බැංකු සංවර්ධන කටයුතු වැඩි දියුණු කිරීම සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවලට ප්‍රාදේශීය කාර්යාලය සිය සහාය ලබා දුනි. නොයෙකුත් ආයතන මගින් පවත්වන ලද සම්මන්ත්‍රණ 30 කට මෙම කාර්යාලය සහභාගී විය. එසේම, ගොවියන් හා අනෙකුත් ප්‍රතිලාභීන් සමග ගම් මට්ටමේ සාකච්ඡා වාර ඒ හා සමාන ගණනක් පැවැත්විය. තවද, ගොවිපොල පාලනය හා මූලිකත්වය ගැනීම සම්බන්ධ පුහුණු වැඩමුළුද ගම් මට්ටමෙන් පවත්වන ලදී.

ගාල්ලේ සිට බිබිල දක්වා ප්‍රදේශයේ ඇති දත්ත රැස්කිරීමේ මධ්‍යස්ථාන 13 ක දත්ත රැස් කරන්නන්ගේ කටයුතු අධීක්ෂණය කිරීමට භාර ගැනීමෙන් මහ බැංකුවේ දිප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ කාර්යය සම්බන්ධීකරණය කිරීම සඳහා ඒකකයක් පිහිටුවන ලදී. මහ බැංකුවේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ණය යෝජනා ක්‍රමය යටතේ මූල්‍යනය කරන ලද ව්‍යාපෘතිවල පසු විපරම් කටයුතු සඳහා පිහිටුවන ලද ඒකකයක් වර්ෂය මුළුල්ලේම ක්‍රියාත්මක විය. මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල පිහිටි කර්මාන්ත ඒකක 35 ක් මෙම කාර්යාලයේ පරීක්ෂාව යටතේ පවතී.

## 2.9 සංඛ්‍යා සටහන

## 1984 දෙසැම්බර් මස අවසානයට මාතර ප්‍රාදේශීය කාර්යාලයේ ස්වයං රැකියා සහ ගම් නගා සිටුවීමේ යෝජනා ක්‍රම යටතේ ඇති ව්‍යාපෘතිවල ප්‍රගතිය

| අංශය | ස්වයං රැකියා යෝජනා ක්‍රමය | | | | ගම් නගා සිටුවීමේ යෝජනා ක්‍රමය | | | | මුළු එකතුව | | | | ගණනය කරන ලද රැකියා ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | නිර්දේශිත මුළු එකතුව | | අනුමත මුළු එකතුව | | නිර්දේශිත මුළු එකතුව | | අනුමත මුළු එකතුව | | නිර්දේශිත මුළු එකතුව | | අනුමත මුළු එකතුව | | |
| | සංඛ්‍යාව | ප්‍රමාණය (රුපියල්) | සංඛ්‍යාව | ප්‍රමාණය (රුපියල්) | සංඛ්‍යාව | ප්‍රමාණය (රුපියල්) | සංඛ්‍යාව | ප්‍රමාණය (රුපියල්) | සංඛ්‍යාව | ප්‍රමාණය (රුපියල්) | සංඛ්‍යාව | ප්‍රමාණය (රුපියල්) | |
| **කෘෂිකර්මාන්තය** | | | | | | | | | | | | | |
| 1. කෘෂිකර්මාන්තය .. | 37 | 1,01,515 | 16 | 55,035 | 4 | 11,000 | 1 | 2,000 | 41 | 1,12,515 | 17 | 57,035 | 20 |
| 2. කිරිහරකුන් ඇතිකිරීම .. | 28 | 1,48,200 | 11 | 68,900 | 7 | 35,200 | 6 | 29,800 | 35 | 1,83,400 | 17 | 98,700 | 18 |
| 3. කුකුළන් ඇතිකිරීම .. | 89 | 5,50,600 | 54 | 3,32,000 | 5 | 46,200 | 4 | 35,400 | 94 | 5,96,800 | 58 | 3,67,400 | 59 |
| 4. එළුවන් ඇතිකිරීම .. | 4 | 12,500 | — | — | 20 | 34,600 | 20 | 34,600 | 24 | 47,100 | 20 | 34,600 | 20 |
| 5. ධීවර කර්මාන්තය .. | 6 | 33,450 | 4 | 16,000 | — | — | — | — | 6 | 33,450 | 4 | 16,000 | 4 |
| **කර්මාන්ත** | | | | | | | | | | | | | |
| 6. බේකරි සහ රස කැවිලි .. | 40 | 1,86,520 | 26 | 1,12,140 | 4 | 13,125 | 3 | 11,000 | 44 | 1,99,645 | 29 | 1,23,140 | 52 |
| 7. අනෙකුත් ආහාර නිෂ්පාදිත .. | 1 | 20,000 | — | — | — | — | — | — | 1 | 20,000 | — | — | — |
| 8. දුම්කොළ/බීඩි .. | 4 | 20,385 | 3 | 16,200 | — | — | — | — | 4 | 20,385 | 3 | 16,200 | 10 |
| 9. අත්යන්ත්‍ර රෙදිපිළි .. | 15 | 68,550 | 12 | 57,050 | 8 | 37,500 | 6 | 27,500 | 23 | 1,06,050 | 18 | 84,550 | 41 |
| 10. ඇඳුම් මැසීම .. | 55 | 2,66,515 | 38 | 1,69,415 | 5 | 30,000 | 4 | 25,000 | 60 | 2,96,515 | 42 | 1,94,415 | 72 |
| 11. අනෙකුත් පේෂකර්ම නිෂ්පාදිත .. | 20 | 98,070 | 10 | 40,370 | 1 | 10,000 | 1 | 10,000 | 21 | 1,08,070 | 11 | 50,370 | 24 |
| 12. වඩු වැඩ .. | 30 | 1,28,070 | 14 | 61,720 | 2 | 10,500 | 2 | 10,500 | 32 | 1,38,570 | 16 | 72,220 | 23 |
| 13. කඩදාසි නිෂ්පාදිත .. | 3 | 14,490 | 2 | 9,090 | — | — | — | — | 3 | 14,490 | 2 | 9,090 | 3 |
| 14. ලෝහ නොවන ඛනිජ .. | 89 | 3,57,945 | 55 | 2,28,825 | 5 | 18,575 | — | — | 94 | 3,76,520 | 55 | 2,28,825 | 152 |
| 15. කළුගල් කැඩීම .. | 10 | 41,640 | 6 | 26,000 | 2 | 5,471 | 2 | 5,250 | 12 | 47,111 | 8 | 31,250 | 20 |
| 16. ලෝහ නිෂ්පාදිත .. | 10 | 46,200 | 9 | 41,200 | — | — | — | — | 10 | 46,200 | 9 | 41,200 | 26 |
| 17. කොහු නිෂ්පාදිත .. | 38 | 1,08,380 | 27 | 75,020 | 12 | 31,210 | 8 | 18,415 | 50 | 1,39,590 | 35 | 93,435 | 42 |
| 18. අළුත්වැඩියා සහ නඩත්තු කිරීම .. | 40 | 2,01,725 | 23 | 1,12,995 | 1 | 5,000 | 1 | 5,000 | 41 | 2,06,725 | 24 | 1,17,995 | 35 |
| 19. අනෙකුත් .. | 38 | 2,04,730 | 23 | 1,20,130 | 7 | 38,170 | 4 | 20,520 | 45 | 242,900 | 27 | 1,40,650 | 40 |
| 20. ගොවි උපකරණ .. | 66 | 21,37,980 | 65 | 21,02,980 | 4 | 14,300 | 4 | 14,300 | 70 | 21,52,280 | 69 | 21,17,280 | 70 |
| 21. රසායනික ද්‍රව්‍ය .. | 6 | 24,800 | 5 | 20,800 | — | — | — | — | 6 | 24,800 | 5 | 20,800 | 5 |
| 22. වෙළෙඳ හා වාණිජ කටයුතු .. | 19 | 95,200 | 13 | 58,900 | — | — | — | — | 19 | 95,200 | 13 | 58,900 | 14 |
| එකතුව | 648 | 48,67,465 | 416 | 37,24,770 | 87 | 3,40,851 | 66 | 2,49,285 | 735 | 52,08,316 | 482 | 39,74,055 | 750 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

රුපියල් 86 කෝටි 80 ලක්ෂයක වටිනාකමින් යුත් වෙක්පත් 1,35,984 ක් 1984 වර්ෂය තුළදී මාතර ප්‍රාදේශීය නිෂ්කාශනාගාරය මගින් නිෂ්කාශනය කරන ලදී.

### 2.10 සංඛ්‍යා සටහන

### 1984 දෙසැම්බර් අවසානයට මාතර ප්‍රාදේශීය කාර්යාලයේ ස්වයං රැකියා සහ ගම් නගා සිටුවීමේ යෝජනා ක්‍රම යටතේ ණය අයකර ගැනීම්

| අංශය | මුදහළ ණය ප්‍රමාණය (රුපියල්) | ආපසු ගෙවීම් | | |
|---|---|---|---|---|
| | | ලැබිය යුතු (රුපියල්) | ගෙවා නිමි ප්‍රමාණය (රුපියල්) | කල් ඉකුත් වූ ප්‍රමාණය (රුපියල්) |
| **කෘෂිකර්මාන්ත** | | | | |
| 1. කෘෂිකර්මාන්තය .. .. | 30,700 | 8,736 | 6,996 | 1,740 |
| 2. කිරි හරකුන් ඇතිකිරීම .. | 54,300 | 24,290 | 15,820 | 8,470 |
| 3. කුකුළන් ඇතිකිරීම .. .. | 1,80,700 | 87,705 | 63,421 | 24,284 |
| 4. එළුවන් ඇතිකිරීම .. .. | 20,500 | 3,000 | 2,310 | 690 |
| 5. ධීවර කර්මාන්තය .. .. | 13,000 | 5,570 | 2,300 | 3,270 |
| **කර්මාන්ත** | | | | |
| 6. බේකරි සහ රස කැවිලි .. | 79,900 | 31,256 | 19,495 | 11,761 |
| 7. අනෙකුත් ආහාර නිෂ්පාදිත .. | — | — | — | — |
| 8. දුම්කොළ/බීඩි .. .. | 16,200 | 14,332 | 5,228 | 9,104 |
| 9. අත්යන්ත්‍ර රෙදිපිළි .. .. | 54,200 | 19,819 | 16,656 | 3,163 |
| 10. ඇඳුම් මැසීම .. .. | 1,36,840 | 72,320 | [illegible] | [illegible] |
| 11. අනෙකුත් පේෂකර්ම නිෂ්පාදිත .. | 32,360 | 26,757 | 20,757 | [illegible] |
| 12. වඩු වැඩ .. .. | 37,770 | 25,089 | 18,233 | [illegible] |
| 13. කඩදාසි නිෂ්පාදිත .. .. | 4,090 | 3,990 | 3,876 | 114 |
| 14. ලෝහ නොවන ඛනිජ .. | 1,03,960 | 89,141 | 68,449 | 20,692 |
| 15. කළුගල් කැඩීම .. .. | 17,000 | 10,135 | 9,395 | 740 |
| 16. ලෝහ නිෂ්පාදිත .. .. | 32,300 | 20,385 | 17,985 | 2,400 |
| 17. කොහු නිෂ්පාදිත .. .. | 70,445 | 39,957 | 33,008 | 6,949 |
| 18. අලුත්වැඩියා සහ නඩත්තු කිරීම .. | 73,232 | 41,113 | 27,256 | 13,857 |
| 19. අනෙකුත් .. .. | 95,430 | 42,887 | 32,464 | 10,423 |
| 20. ගොවි උපකරණ .. | 19,12,450 | 4,11,063 | 3,88,767 | 22,296 |
| 21. රසායනික ද්‍රව්‍ය .. .. | 20,800 | 13,285 | 9,355 | 3,930 |
| 22. වෙළෙඳ හා වාණිජ කටයුතු .. | 52,900 | 18,559 | 15,410 | 3,149 |
| එකතුව .. | 30,39,077 | 10,09,389 | 8,33,913 | 1,75,476 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

## ප්‍රාදේශීය කාර්යාලය - අනුරාධපුරය

ණය පහසුකම් සැලසීම මගින් ප්‍රදේශය තුළ සිටින, විශේෂයෙන්ම, අඩු ආදායම් ලබන්නන්ගේ ආර්ථික වර්ධනය ඇති කරලීමෙහි නිරත වීමේ තම අභිමතාර්ථය සිය කටයුතු ආරම්භකොට තුන්වෙනි වසර වූ 1984 දීත් අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය විසින් නොකඩවා ඉටු කරන ලදී. කාර්යාලය ආරම්භ කළ මුල් වර්ෂයේදී පටන්ගත් විශේෂ සංවර්ධන ණය යෝජනා ක්‍රමය (වි.සං.ණ.යෝ.) ක්‍රියාත්මක කිරීමට ප්‍රමුඛත්වය දෙන ලදී. එසේ කරන ලද්දේ මෙම යෝජනා ක්‍රමයට වාණිජ බැංකු වඩා අර්ථදායක ලෙස හා ක්‍රියාකාරී ලෙස සහභාගී කරවා ගැනීම පිණිසය.

වර්ෂයේ මුල් තුන් මාසය තුළ පැවැති අධික වර්ෂාව සහ ජලගැලීම්වලින් ප්‍රදේශයේ වගාව විනාශවීම නිසා පුනරුත්ථාපන වැඩ සටහන් ඇති කිරීමට හා සමහර ණය නැවත ලේඛනගත කිරීමට ද, ආරක්ෂක කටයුතු අඩපණවීම නිසා උතුරු ප්‍රදේශයේ බැංකු කටයුතු සීමා කිරීමටද සිදු වුවත්, ණය දීමේ කටයුතු සමස්තයක් වශයෙන් සලකන විට සතුටුදායක ලෙස සිදු විය. මහ බැංකුවේ පරමාර්ථය ගැන පැහැදිලි අවබෝධයකින් යුතුව බැංකුකරුවන්, ප්‍රාදේශීය කාර්යාලය මගින් හඳුන්වා දෙන ලද නවත් ව්‍යාපෘති වලට මූල්‍ය පහසුකම් සලසන ලද අතර, දැනටමත් ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන් නිසා ආදායම් අංශය, රැකියා උත්පාදනය හා ණය ආපසු ගෙවීම සම්බන්ධයෙන් දිරිගන්වන සුළු ප්‍රතිඵල ඇති විය.

විශේෂ සංවර්ධන ණය යෝජනා ක්‍රමය යටතේ ව්‍යාපෘති 954 ක් හඳුන්වා දෙන ලද අතර, එයින් 237 ක් ක්‍රියාත්මක වෙමින් පැවතිණ. අනුරාධපුර දිස්ත්‍රික්කයේ තෝරා ගත් ගම් 100 කටත් වැඩි ගණනකට අවධානය යොමු කොට ඒවායේ වැසියන් ගෙන් දළ වශයෙන් 25,000 කටත් 30,000 කටත් අතර පිරිසකට බැංකුවලින් ඔවුනට අත්කරගත හැකි වාසි හා බැංකු ක්‍රමයට ඇබ්බැහිවීමෙන් ලබා ගත හැකි ප්‍රයෝජන ගැනද අවබෝධයක් ප්‍රාදේශීය කාර්යාලය මගින් ලබා දෙන ලදී. අනුක්‍රමයෙන් ඉදිරියට ගෙන යන පදනමක් මත සංවිධානය කර ඇති මෙම ව්‍යාපාරයේ සාර්ථකත්වය, ඉහත කී යෝජනා ක්‍රමයෙන් ප්‍රයෝජන ලබා ගැනීමට එන පිරිස වැඩිවීමෙන් පැහැදිලිවම පිළිබිඹු වෙයි.

වි.සං.ණ. යෝජනා ක්‍රමයේ ස්ථාවර ප්‍රගතියක් ඇති කිරීමේ අදහස පෙරදැරි කොට ගෙන, කෘෂි, පශු සම්පත් හා සෞඛ්‍ය යන දෙපාර්තමේන්තු, දිස්ත්‍රික්ක පරිපාලනය හා මූලික මට්ටමේ නිලධාරීන් ආදී අනෙකුත් ආයතන හා නියෝජ්‍යත්වයන් සමඟ ප්‍රාදේශීය කාර්යාලය වැඩි සම්බන්ධතාවයකින් යුතුව කටයුතු කළේය. යෝජනා ක්‍රමයේ කටයුතුවල කාර්යක්ෂමතාවය තීව්‍ර කරනු සඳහා තෝරාගත් සංඝන ප්‍රදේශයන්හි ණය ගන්නවුන් හඳුනා ගැනීමේ පරිශ්‍රමයක් දරන ලදී. වෙනස්වන අවශ්‍යතාවයන්ට වඩාත් ගැලපෙන අන්දමින් මුහුණ දීම සඳහා ක්‍රියාකාරී ප්‍රතිපත්තිමය සංශෝධන කීපයක්ද සිදුකරන ලදී. සුළු පරිමාණයේ කර්මාන්ත සහ සතුන් ඇතිකිරීමේ ව්‍යාපෘති සඳහා සපයන මුදල් ප්‍රමාණය පිළිවෙලින් රුපියල් 25,000 සහ රුපියල් 10,000 වශයෙන් වැඩි කරන ලදී. බිම් සකස් කිරීමේ කටයුතු උදෙසා රෝද දෙකේ ට්‍රැක්ටර්, කෘෂි උපකරණ හා මූල්‍යමය පහසුකම් සැලසීම ඇතුළත් කිරීමෙන් ණය ක්‍රමයේ ආවරණ ක්ෂේත්‍රය තවත් පුළුල් කරන ලදී.

වර්ෂය තුළ ව්‍යාපෘති 317 ක් හඳුන්වා දෙනු ලැබූ අතර, ඉන් 103 ක් බැංකු විසින් අනුමත කරනු ලැබිය. කෘෂිකර්ම හා සතුන් ඇති කිරීමේ ව්‍යාපෘතීන් ද මීට ඇතුළත් වූ අතර, එසේ හඳුන්වා දෙන ලද ව්‍යාපෘතීන්ගෙන් සියයට 75 ක් වූයේ ඒවාය. කෘෂිකර්ම කටයුතු සම්බන්ධයෙන් කණින ලද ළිං භාවිතය ද දිරි ගන්වන ලදී. වර්ෂය තුළ බැංකු මගින් ව්‍යාපෘති ණය සඳහා වෙන් කළ මුළු ප්‍රමාණය රුපියල් 18 ලක්ෂයක් වූ අතර, ඉන් රුපියල් 14 ලක්ෂයක ණය ලබා දී තිබුණි.

ජල ගැල්මෙන් හානියට පත් ව්‍යාපෘති නිසා රැකියා අවස්ථා අහිමි වීම පිළිබඳව සළකන විට, 204 දෙනෙක් ඔවුන් යෙදී සිටි රැකියාවන්හිම යළි යෙදී සිටින බවත්, පුද්ගලයන් 89 දෙනෙක් දැනට ක්‍රියාත්මකව පවතින ව්‍යාපෘතීන්හි අළුතින් රැකියා අවස්ථා සපයාගෙන ඇති බවත් ගණනය කොට ඇත. සංසන්දනාත්මකව බලන විට කෘෂි ව්‍යාපෘතිවල ආදායම් ඉපදවීමේ ශක්තිය තරමක් වැඩි වුව ද, රැකියා උත්පාදනය අතින් කුඩා පරිමාණ කාර්මික ව්‍යාපෘතීන් ඉහළ ධාරිතාවයකින් යුත් බව පෙනී ගොස් ඇත. සමාලෝචිත වර්ෂය තුළදී දැනට ක්‍රියාත්මකව පවතින ව්‍යාපෘතීන් මගින් උපදවන ලද සමස්ත දළ ආදායම රුපියල් 70 ලක්ෂයක් වනු ඇතැයි ගණන් බලා තිබේ. ණය ලාභීන්ට සැලසූ උපදෙස් දීම, මග පෙන්වීම් හා ණය දීම නියමිත අවස්ථාවේදී සිදුකිරීම හා සූක්ෂම වගා ක්‍රම පිළිබඳව කරන ලද පුහුණු කිරීම් එකී කෘෂිකර්ම ව්‍යාපෘතීන් බොහෝ ගණනක සාර්ථකත්වයට ප්‍රධාන වශයෙන් සාධක විය.

1984 දෙසැම්බර් මස අවසානය වන විට ව්‍යාපෘතීන් 199 ක් වෙනුවෙන් දෙන ලද ණය මුදල්, ආපසු ගෙවීමට නියමිතව තිබිණ. ණය ලාභීන් 14 දෙනෙක් සිය ණය මුදල් සම්පූර්ණයෙන්ම ආපසු ගෙවන ලදී. 1983 වර්ෂයේ සියයට 86 ක අනුපාතිකය හා සසඳනවිට, 1984 වර්ෂයේ ආපසු ගෙවීමේ අනුපාතිකය පහත වැටී ඇති බව පෙනී යයි. එසේ වුව ද, තවමත්, ණය ආපසු ගෙවීමේ අනුපාතිකය සියයට 70 කට ආසන්නව පවතී. වර්ෂයේ මුල් භාගයේ දී ව්‍යාපෘතීන් සමහරකට එල්ල වූ විනාශය ණය ආපසු ගෙවීම් අඩපණ වීමට හේතු වූ අතර, හිතාමතාම ණය ආපසු ගෙවීම පැහැර හැර ඇති අවස්ථා කීපයක් ගැනද දැනගන්නට ලැබී ඇත. එසේ හානි සිදුවූ ව්‍යාපෘතීන් සම්බන්ධයෙන් පුනරුත්ථාපන වැඩ පිළිවෙලවල් හා ණය මුදල් නැවත ලේඛනගත කිරීමට කටයුතු පිළියෙල කර ඇති අතර, හිතාමතා ණය ආපසු ගෙවීම් පැහැර හැරී අයට විරුද්ධව නීති මගින් කටයුතු කිරීමට ද පිළියෙල කොට ඇත.

## 2.11 සංඛ්‍යා සටහන

### 1984 දෙසැම්බර් අවසානයට අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලයේ ගම් නගා සිටුවීමේ හා ස්වයං රැකියා යෝජනා ක්‍රම යටතේ ඇති ව්‍යාපෘතිවල ප්‍රගතිය

වටිනාකම රුපියල් '000

| වර්ගය | බැංකු වෙත ඉදිරිපත් කළ ව්‍යාපෘති සංඛ්‍යාව | | බැංකු විසින් අනුමත කළ ව්‍යාපෘති සංඛ්‍යාව | | මූල්‍යකරණය කරන ලද ව්‍යාපෘති | | | | ආපසු ගෙවීම | | | | ඇස්තමේන්තුගත ආදයම | සේවා නියුක්තිය | [illegible] ලද ඒකක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ඒකක | වටිනාකම | ඒකක | වටිනාකම | ඒකක | බැංකු ණය | ණය කරුගේ දයකත්වය | එකතුව | ආපසු ගෙවිය යුතු ඒකක සංඛ්‍යාව | 1984 දෙ: අවසානයට ගෙවීමට තිබූ මුළු මුදල | 1984 දෙසැ. අවසානයේදී ගෙවනලද මුළු මුදල | නොගෙවා තිබූ මුළු මුදල | | | |
| **උස්සාන වාරිමාර්ග යටතේ කෘෂිකර්මය** | | | | | | | | | | | | | | | |
| වතුර පොම්ප සවිකළ සාරන ලද ළිං | 288 | 2,529·8 | 87 | 765·6 | 76 | 656·3 | 151·7 | 808·0 | 65 | 105·8 | 73·7 | 32·2 | 228·0 | 112 | 4 |
| කෙසෙල් වගාව | 3 | 13·3 | 1 | 3·5 | 1 | 3·5 | 0·5 | 4·0 | — | — | — | — | 0·8 | 1 | |
| සුළං බල යන්ත්‍රය | 29 | 401·2 | 1 | 22·5 | 1 | 22·5 | 2·5 | 25·0 | 1 | 1·4 | 1·4 | — | 3·0 | 4 | |
| රෝද දෙකේ ට්‍රැක්ටර් | 2 | 80·0 | — | — | — | — | — | — | — | — | — | — | — | — | |
| **සත්ව පාලනය** | | | | | | | | | | | | | | | |
| කුකුල් පාලනය | 77 | 474·2 | 29 | 173·0 | 22 | 125·5 | 41·0 | 166·5 | 22 | 32·7 | 24·1 | 8·6 | 8·0 | 7 | |
| කිරිපට්ටි පාලනය | 138 | 800·7 | 24 | 128·1 | 12 | 61·2 | 9·9 | 71·1 | 6 | 5·3 | 4·3 | 1·0 | 10·1 | 12 | |
| එළුවන් පාලනය | 149 | 602·3 | 43 | 160·5 | 35 | 23·0 | 17·1 | 140·1 | 24 | 23·4 | 18·1 | 5·3 | 24·0 | 35 | 2 |
| ඌරු පාලනය | 78 | 248·1 | 22 | 79·5 | 17 | 59·8 | 19·5 | 79·2 | 16 | 16·5 | 9·9 | 6·6 | 10·0 | 10 | 1 |
| **කර්මාන්ත** | | | | | | | | | | | | | | | |
| කොන්ක්‍රීට් වැඩ | 2 | 8·6 | — | — | — | — | — | — | — | — | — | — | — | — | |
| ගඩොල් නිෂ්පාදනය | 11 | 46·3 | 5 | 22·8 | 3 | 14·5 | 3·5 | 18·0 | 3 | 8·8 | 2·8 | 6·0 | 2·0 | 2 | |
| බේකරි සහ රසකැවිලි | 39 | 223·3 | 21 | 102·4 | 18 | 84·4 | 40·1 | 124·5 | 18 | 58·4 | 42·7 | 15·7 | 180·0 | 30 | |
| කම්මල්, ටින්කර් වැඩ සහ ට්‍රැක්ටර් නඩත්තුව | 13 | 90·8 | 5 | 67·6 | 4 | 35·6 | 8·4 | 44·0 | 2 | 2·0 | 2·0 | — | 10·0 | 4 | 2 |
| වඩුවැඩ හා ලී කැටයම් | 15 | 106·0 | 10 | 72·4 | 9 | 65·1 | 19·5 | 84·7 | 8 | 25·1 | 20·8 | 4·2 | 20·0 | 8 | |
| බීඩි හා සුරුට්ටු නිෂ්පාදනය | 4 | 19·9 | 3 | 13·9 | 3 | 13·9 | 2·7 | 16·6 | 3 | 8·5 | 7·6 | 0·9 | 18·0 | 12 | |
| රෙදිපිළි නිෂ්පාදන හා බතික් | 21 | 144·2 | 8 | 55·5 | 8 | 55·5 | 23·4 | 79·0 | 5 | 9·7 | 8·9 | 0·8 | 30·0 | 20 | 3 |
| කොහු නිෂ්පාදනය | 7 | 27·3 | 4 | 14·8 | 4 | 14·8 | 2·3 | 17·1 | 4 | 7·5 | 4·2 | 3·4 | 5·0 | 4 | |
| ලිපි ද්‍රව්‍ය හා සබන් නිෂ්පාදනය | 3 | 20·3 | 1 | 5·5 | 1 | 5·5 | 1·2 | 6·7 | 1 | 5·3 | 3·4 | 1·8 | 2·0 | 1 | |
| ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය | 2 | 9·0 | 1 | 3·0 | 1 | 3·0 | 1·0 | 4·0 | 1 | 1·9 | 1·9 | — | 2·8 | 2 | |
| සම්භාණ්ඩ නිෂ්පාදනය | 2 | 21·0 | — | — | — | — | — | — | — | — | — | — | — | — | |
| මැටි කර්මාන්තය | 11 | 65·5 | 1 | 10·0 | — | — | — | — | — | — | — | — | — | — | |
| බැටරි ඇසිඩ් නිෂ්පාදනය | 1 | 45·0 | — | — | — | — | — | — | — | — | — | — | — | — | |
| විසිතුරු මාළු ඇති කිරීමේ කර්මාන්තය | 1 | 10·0 | — | — | — | — | — | — | — | — | — | — | — | — | |
| **සේවා** | | | | | | | | | | | | | | | |
| ගෘහ ප්‍රයෝජනයට ගන්නා ආහාර සහ ද්‍රව්‍ය | | | | | | | | | | | | | | | |
| ඇසුරුම් හා වෙළෙඳාම | 15 | 59·5 | 4 | 11·0 | 3 | 8·0 | 1·4 | 9·4 | 2 | 4·9 | 1·3 | 3·6 | 6·0 | 3 | 1 |
| පාපැදි අලුත්වැඩියා කිරීමේ ඒකක | 25 | 162·0 | 10 | 47·5 | 10 | 47·5 | 20·5 | 68·0 | 10 | 13·6 | 12·0 | 1·6 | 23·6 | 12 | |
| ඡායාරූප ශිල්පය | 2 | 15·0 | 1 | 8·5 | 1 | 8·5 | 5·0 | 13·5 | 1 | 5·2 | 5·3 | — | 3·0 | 1 | |
| බාබර් වැඩ | 7 | 24·9 | 4 | 14·8 | 4 | 14·9 | 3·3 | 18·1 | 4 | 4·8 | 3·1 | 1·7 | 4·5 | 7 | |
| විදුලි භාණ්ඩ අළුත් වැඩියාව | 2 | 26·0 | 1 | 16·0 | 1 | 16·0 | 8·0 | 24·0 | 1 | 1·3 | 1·3 | — | 12·4 | 3 | |
| බැටරි යළි පිරවීම | 2 | 16·4 | 2 | 16·4 | 2 | 16·4 | 5·0 | 21·4 | 1 | 2·5 | 2·5 | — | 2·1 | 1 | 1 |
| ප්‍රවාහන සේවා | 1 | 2·0 | — | — | — | — | — | — | — | — | — | — | — | — | |
| නාම පුවරු ඇඳීම | 1 | 5·0 | 1 | 5·0 | 1 | 5·0 | 0·6 | 5·6 | 1 | 1·1 | 1·1 | — | 4·0 | 2 | |
| ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා ඒකක | 3 | 15·5 | — | — | — | — | — | — | — | — | — | — | — | — | |
| එකතුව | 954 | 6,313·1 | 289 | 1,819·8 | 237 | 1,460·4 | 388·1 | 1,848·5 | 199 | 345·7 | 252·4 | 93·4 | 609·3 | [illegible] | 14 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

කෘෂි සංවර්ධනය, සෞඛ්‍ය සහ අධ්‍යාපන යන ක්ෂේත්‍රයන් ආවරණය කරමින් හොරොව්පතාන උප දිසාපති කොට්ඨාශයෙහි ගලහිටියාගමදී සංගෘහිත ග්‍රාමසංවර්ධන වැඩ පිළිවෙලක් ඵලදායක අන්දමින් ක්‍රියාත්මක කරන්නට යෙදිණ. විශේෂ පුහුණු කිරීමේ වැඩ සටහන්, ක්ෂේත්‍ර චාරිකා හා ප්‍රදර්ශන උපයෝගී කරගනිමින් සිය වගා කටයුතුවලදී උසස් ශිල්පීමය ක්‍රම යොදා ගැනීමට ගම්වැසියන් දිරිගන්වන ලදී. ජල ගැල්මෙන් හානි සිදුවුව ද ගොවීන් විසින් ඉතාමත් සාර්ථක අස්වැන්නක් ලබා ගැනීමෙන් ම මෙම වැඩපිළිවෙලේ සතුටුදායකත්ත්වය පෙනී යයි. විශේෂයෙන් ම ළමා අංශයේ අධ්‍යාපනික හා සෞඛ්‍ය සංවර්ධනය සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සම්පාදනය කැරිණ. මේ සම්බන්ධව අවට ගම් පහකින්ම බැංකුවේ ආධාර ඉල්ලා තිබීමෙන් මෙම වැඩ පිළිවෙලෙහි සමස්ත බලපෑම යහපත් බව පැහැදිළිවම පෙනී යයි.

1984 වර්ෂය තුළ, බෝග වගාව හා පශු සම්පත් සංවර්ධනය අළලා ප්‍රාදේශීය කාර්යාලය මගින් පුහුණු කිරීමේ වැඩ සටහන් 16 ක් පවත්වන්නට යෙදිණි. සූක්ෂ්ම වගා කටයුතු සඳහා අවශ්‍ය ශාස්ත්‍රිය පසුතලය දේශන මගින් සැපයුන අතර, පොලොව සකස් කිරීම, ළිං ජලය සකසුරුවමින් ප්‍රයෝජනයට ගැනීම, වතුර පොම්ප ආරක්ෂා සහිතව පරිහරණය කිරීම්, පැල තවාන් දැමීම හා පොහොර සහ පලිබෝධ නාශක භාවිතය පිළිබඳව ක්ෂේත්‍ර චාරිකා හා ප්‍රදර්ශන මාර්ගයෙන් සහභාගිවූවනට අවශ්‍ය ප්‍රායෝගික දැනුම ලබා දෙන ලදී. මෙම වැඩ සටහන්වලින් මේ දක්වා පුද්ගලයන් 1,600 කට ආසන්න ප්‍රමාණයක් ප්‍රයෝජනය ලබා ගෙන ඇති අතර කෘෂිකර්ම, පශු සම්පත් හා සෞඛ්‍යය යන දෙපාර්තමේන්තුවල විශේෂඥ උපදෙස් මෙකී පුහුණු පාඨමාලා පැවැත්වීමේ දී ප්‍රයෝජනයට ගන්නට යෙදිණි. ව්‍යාපෘති පරිපාලනය හා ගිණුම් කටයුතු සම්බන්ධයෙන් ග්‍රාමීය ආයෝජකයිනට විස්තරාත්මක අවබෝධයක් ලබා දීම සඳහා තරුණ කටයුතු හා රැකීරක්ෂා අමාත්‍යාංශය හා කාර්මික සංවර්ධන මණ්ඩලය වැනි අනිකුත් නියෝජ්‍යාත්ව විසින් පවත්වන්නට යෙදුන පුහුණු වැඩ සටහන් ප්‍රාදේශීය කාර්යාල මගින් ප්‍රයෝජනයට ගන්නා ලදී.

කාර්යක්ෂම අන්දමින් ණය බෙදා හැරීමේ ක්‍රමයක් ඇතිකරලීමටත්, ක්‍රියාකාරිත්ව හා ආයතනික ධාරිතාවය ශක්තිමත් කිරීමටත්, ප්‍රාදේශීය කාර්යාලය හා සංවර්ධන කාර්යයන්හි නියැලි අනෙකුත් තැනැත්තන් අතර ඇති සම්බන්ධතාවයන් හා අදහස් හුවමාරුකර ගැනීම් නිරතුරුව ම සිදුවන බවට වග බලා ගැනීමටත් ප්‍රාදේශීය කාර්යාලය උනන්දුවෙන් කටයුතු කරන ලදී. මේ කාරියෙහිලා බැංකු නිලධාරීන්, කෘෂි සංවර්ධන අධිකාරියේ කළමණාකරුවන්, ග්‍රාමෝදය සභාපතිවරුන් හා මහජනතාව සමඟ ලඟින් කටයුතු කරන අනෙකුත් නිලධාරීන් වෙනුවෙන්, සමාලෝචිත වර්ෂය තුළදී සම්මන්ත්‍රණ, වැඩමුළු සහ සාකච්ඡා කීපයක්ම පවත්වන ලදී. මහ බැංකුවේ දීප ව්‍යාප්ත දත්ත එක්රැස් කිරීමේ වැඩ සටහනට සහයෝගය දීම සහ එහි කටයුතු අධීක්ෂණය කිරීම ප්‍රාදේශීය කාර්යාලය මගින් තව දුරටත් කරගෙන යන ලදී. සුමක යෝජනා ක්‍රමය යටතේ වූ ව්‍යාපෘතීන් පරීක්ෂා කිරීමේ කටයුතු, ව්‍යාපෘති විශාල ප්‍රමාණයක් ආවරණය වන පරිදි ව්‍යාප්ත කරන්නට යෙදිණ. සමාලෝචිත වර්ෂය තුළදී එවැනි ව්‍යාපෘති 25 ක් පරීක්ෂා කරන ලදී. ඉතා කුඩා කර්මාන්ත අංශයේ ව්‍යාපෘතීන් පිළිබඳ දත්තයන් එක්රැස් කිරීම තව දුරටත් කරගෙන යන ලදී. දැනට ඉතා කුඩා කර්මාන්ත අංශයේ ව්‍යාපෘතිවල ප්‍රගතිය සහ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වාර්තාවක් පිළියෙල වෙමින් පවතී. දිස්ත්‍රික් පරිපාලන කාර්යාලය මගින් සම්බන්ධීකරණය කරනු ලැබ දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය පරීක්ෂකවරුන් විසින් 1984 සැප්තැම්බර් මාසය තුළ පවත්වනු ලැබූ "සෞඛ්‍ය මාසය" වැඩ සටහනේ ක්‍රියාකාරිත්වය සමාලෝචනය කිරීම සඳහා සමීක්ෂණයක් පවත්වන්නට යෙදිණ. මෙහිදී අනාවරණය වූ කරුණු පදනම් කරගත් වාර්තාවක් දිස්ත්‍රික් බලධාරීන් වෙත ඉදිරිපත් කරන ලදී.

ප්‍රාදේශීය කාර්යාලයේ නිෂ්කාශනාගාරය මගින් රුපියල් 14 කෝටි 85 ලක්ෂයක වටිනාකමින් යුත් චෙක්පත් නිෂ්කාශණය කරන ලදී.

**අනුග්‍රාහක සේවා**

මහ බැංකුව, වාණිජ බැංකු සහ සංවර්ධනය උදෙසා කැපවුන සමහර අමාත්‍යාංශ හා රාජ්‍ය සංස්ථාවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත බැංකු කටයුතු පිළිබඳ අනුග්‍රාහක සේවා කමිටුව, 1981 වර්ෂය මැද දී පිහිටුවනු ලැබිය. වාණිජ බැංකු සිය අනුග්‍රාහකයින්ට සලසනු ලබන සේවා තවත් දියුණු කිරීමේ පරමාර්ථය ප්‍රධාන තැන්හි ලා එමගින් කටයුතු කරගෙන යනු ලැබේ. මහ බැංකුවේ විනිමය පාලන සහ බැංකු කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තු විසින් 1977–1983 කාල පරිච්ඡේදය තුළදී නිකුත් කරන ලද චක්‍රලේඛ/මෙහෙයවුම් උපදෙස් අඩංගු සූචියක් සම්පාදනය කිරීමෙහි ලා 1984 වර්ෂය තුළදී කමිටුව කටයුතු කරන ලදී. මෙම කටයුත්ත කරන ලද්දේ, මෑත කාලයේදී සිය කටයුතු ශ්‍රී ලංකාවේ අරඹන ලද නව බැංකු වලට සහාය වීම සඳහාය. තවද, බැංකු කටයුතු සම්බන්ධයෙන් අනුග්‍රාහකයින්ට දෙනු ලබන සේවා පිළිබඳව සමීක්ෂණයක් පැවැත්වීමේ මූලික කටයුතු කමිටුව මගින් නිම කරන ලද අතර, නියැදි ආදර්ශ පදනමක් අනුව අනුග්‍රාහකයින් 10,000 කට 1985 වර්ෂය මුලදී ප්‍රශ්න මාලාවක් යැවීමට අදහස් කර ඇත.

**ප්‍රකාශන**

මුදල් නීති පනතේ 35 වැනි වගන්තිය ප්‍රකාර, 1983 වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව, ගරු මුදල් හා ක්‍රම සම්පාදන ඇමතිතුමා වෙත පිළිගන්වන ලදී. අනතුරුව, 1983 වර්ෂය සඳහා වූ ආර්ථික විවරණය ද ප්‍රකාශයට පත්කරන ලදී. මාසික විවරණිකාව ද නිති පතා පළකරන ලදී. 1984 වර්ෂයේ ප්‍රථම භාගයේ කටයුතු පිළිබඳ විවරණයක් ' ආර්ථික හැඩගැස්ම–1984 ප්‍රථම භාගය ' යනුවෙන් වර්ෂය තුළදී පළ කෙරිණ.

වර්ෂය තුළදී, 1981/1982 පාරිභෝජන සමාජ ආර්ථික සමීක්ෂණ වාර්තාවේ 1 වැනි කොටසද, විස්තරාත්මක සංඛ්‍යා සටහන් වලින් යුත් 1978/1979 දී පවත්වන ලද පාරිභෝජන සමාජ ආර්ථික සමීක්ෂණ වාර්තාවේ II වැනි කොටසද, ප්‍රකාශයට පත් කරන ලදී. දිප ව්‍යාප්ත දත්ත රැස්-කිරීමේ ක්‍රමය යටතේ එක් රැස් කරන ලද දත්තයන්ගෙන් සමන්විත 1983 මිළ සහ වැටුප් සංඛ්‍යාන, වර්ෂය තුළදී නිකුත් කරන ලදී. වර්ෂය පිළිබඳ මූලික දත්ත ඇතුළත් 1984 සමාජ–ආර්ථික දත්ත පත්‍රිකාවද නිකුත් කෙරිණ. 1982/1983 සිට 1985/1986 කාලපරිච්ඡේදයට අදාළ ව්‍යාපාර කටයුතු සහ පෞද්ගලික ආයෝජන පිළිබඳ වාර්තාවක් ද පළ කරන ලදී.

කෘෂි ණය පිළිබඳ තොරතුරු ඇතුළත් ' ණය විවරණිකාව ' අංක 4 පළ කරන ලද අතර, ශ්‍රී ලංකාවේ බැංකු කටයුතු පිළිබඳ අත් පොතෙහි සිංහල පරිවර්තනය, ඒ සඳහා වූ අධික ඉල්ලුම සපුරාලනුවස් නැවත මුද්‍රණය කරන ලදී.

ආචාර්ය ආර්. ඩයස් බණ්ඩාරනායක විසින් සම්පාදිත ' ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය–එහි අනාගතය හා ඒ අංශයේ ක්‍රියාවලිය වැඩි දියුණු කිරීමේ ක්‍රම ' යන අංක 7 දරන කාලීන පත්‍රිකාවද, ආචාර්ය නිමල් සඳරත්න විසින් සම්පාදිත ' ග්‍රාමීය ඉතිරි කිරීම් රාශිකරණය ' යන අංක 8 දරණ කාලීන පත්‍රිකාවද මේ වර්ෂය තුළ ප්‍රකාශයට පත්කරන ලදී.

' නිව්ස් සර්වේ ' ඉංග්‍රීසි ප්‍රකාශනය සහ එහි සිංහල පරිවර්තනය ' සටහන ' ද නොකඩවා පළ කරන ලදී. මේවාට තිබෙන ඉල්ලුම ඉහළ යාමෙන් පෙනී යනුයේ ප්‍රකාශන දෙකම පාඨක ජනතාව අතර ජනප්‍රිය වී ඇති බවය.

කෘෂිකර්මය, ග්‍රාමීය සංවර්ධනය හා ණය පිළිබඳ සෑම දත්තයක්ම මහ බැංකුව මගින් එක්රැස් කිරීම නොකඩවා සිදු කළ අතර, එම දත්ත අර්ධ වාර්ෂික විවරණිකාවක් වශයෙන් 1984 දී නිකුත් කරන ලදී. 1983 දී ආරම්භ කරන ලද ' ගැමි ණය තොරතුරු ' යන ත්‍රෛමාසික සඟරාව සහ කෘෂිකාර්මික යෙදවුම්වල සිල්ලර මිළ පිළිබඳ විවරණිකාවද නොකඩවා පළ කරන්නට යෙදුණි.

## සම්මන්ත්‍රණ

1984 අගෝස්තු මාසයේ දී මහ බැංකුව විසින් කලාපීය රටවල් වල නියෝජිතයින් 21 දෙනෙකු සහභාගී වූ ආසියානු හා ශාන්තිකර කලාපීය කෘෂිකාර්මික ණය සංගමයේ සහ ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ජර්මන් පදනමේත් ජ්‍යෙෂ්ඨ විධායක පාඨමාලා/සංචාරක වැඩ සටහන සංවිධානය කරන ලදී. සංවිධානය කිරීම සහ මූල්‍යකරණය පිළිබඳ කටයුතුවලදී මහජන බැංකුවේ සහ ලංකා බැංකුවේ සහාය මහ බැංකුවට නොමඳව ලැබුණි. කොළඹදී පවත්වන ලද සම්මන්ත්‍රණයක් ද, මහජන බැංකුව, ලංකා බැංකුව සහ මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල ද විසින් ආධාර දෙනු ලැබූ රට තුළ නොයෙකුත් ප්‍රදේශවල පිහිටි ව්‍යාපෘති, දින 8 ක් තිස්සේ නැරඹීමද මෙකී පාඨමාලා/සංචාරයට ඇතුළත් විය.

අග්නිදිග ආසියානු මහ බැංකු (සියැසන්) පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය මගින් සංවිධානය කොට, 1984 ජූලි 23 සිට අගෝස්තු 24 දින දක්වා පවත්වන ලද " මූල්‍ය ආයතන පරීක්ෂණය හා අධීක්ෂණය" නම් වූ අටවැනි සියැසන් පුහුණු පාඨමාලාව මහ බැංකුවේ අනුග්‍රහයෙන් පවත්වන ලදී. මෙම පාඨමාලාව වාණිජ බැංකු හා අනෙකුත් මූල්‍ය ආයතන හසුරුවීමේ කටයුතුවල කෙලින්ම නියුක්තවූ මහ බැංකු හා මූල්‍ය අධිකාරී නිලධාරීන් සඳහා සකස් කරන ලද එකක් වූ අතර, ඉන්දුනීසියානු බැංකුව, මැලේසියා නෙගේරා බැංකුව, නේපාල රාෂ්ට්‍ර බැංකුව, සිංගප්පූරුවේ මුදල් අධිකාරිය, තායිලන්ත බැංකුව හා ශ්‍රී ලංකා මහ බැංකුව යන ආයතනවල නිලධාරීහු ඊට සහභාගී වූහ.

## සමීක්ෂණ

'1970 සිට ශ්‍රී ලංකාවේ ජීවන මට්ටම් සහ ප්‍රතිපත්ති පිළිබඳ පරිණාමය' යන මැය යටතේ ලෝක බැංකුවේ සහාය ඇතිව අරඹන ලද විශ්ලේෂණාත්මක අධ්‍යයනය, සමාලෝචිත වර්ෂය තුළද තව දුරටත් කරගෙන යනු ලැබීය. රාජ්‍ය ප්‍රතිපත්ති අභිලාශයන් මධ්‍යයේ පසුගිය දශකය තුළ ශ්‍රී ලංකාවේ ජීවන මට්ටම් පිළිබඳ උපනතීන් විශ්ලේෂණයට භාජනය කිරීම මෙම අධ්‍යයනයේ අදහස විය.

1983 ජූලි කලබල වලින් හානියට පත් වාණිජ හා කාර්මික ආයතනවල ට සිදුවූ අලාභය සම්බන්ධව සමීක්ෂණයක් කළ වැඩ බලමුළුවේ වාර්තාව පිළිබඳව පසු විපරම් අධ්‍යයනයක් පෙබරවාරි මාසයේදී පැවැත්විණි. හානියට පත් කර්මාන්ත හා වෙළෙඳ ආයතන පුනරුත්ථාපනය කිරීම හා නැවත ගොඩනැගීම පිළිබඳ ප්‍රගතිය තක්සේරු කිරීම මෙම අධ්‍යයනයේ අදහස විය. මැදි හා දිගු කාලීන ණය අරමුදල් ක්‍රමය යටතේ වූ එක් ණය යෝජනා ක්‍රමයක් වූ මාතලේ දිස්ත්‍රික්කයේ සංගෘහිත ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ රෝද දෙකේ ට්‍රැක්ටර් මිළට ගැනීම සඳහා වූ ණය ක්‍රමයේ ඇගැයීම් අධ්‍යයනයක්ද පවත්වන ලදී.

ආනයන ණයවර ලිපි පිළිබඳ මාසික දත්ත ලබා ගනිමින් විවෘත ආනයන වැඩ පිළිවෙළ සමීක්ෂණය කිරීම නොකඩවා කෙරිණ.

## පුහුණු කිරීම්

වර්ෂය තුළදී, අධ්‍යාපනික හා ප්‍රායෝගික අංශයන්හි බැංකු නිලධාරීන් පුහුණු කිරීමේ වැඩ පිළිවෙල මහ බැංකුව විසින් තව දුරටත් කරගෙන යනු ලැබීය. අධ්‍යයන පාඨමාලා, ප්‍රධාන වශයෙන්ම, ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන පශ්චාත් උපාධි අධ්‍යයනය සඳහා සීමා විය. කෙටි කාලීන පාඨමාලා, සම්මන්ත්‍රණ, අධ්‍යයන චාරිකා යනාදී වශයෙන් වූ ප්‍රායෝගික පුහුණුවීම් වලට ග්‍රාමීය සංවර්ධනය, කෘෂිකාර්මික හා කාර්මික ණය, බැංකු කටයුතු, ආර්ථික විද්‍යා සහ පරිගණක විද්‍යා අධ්‍යයනය ආදී අදාළ ක්ෂේත්‍ර ඇතුළත් විය. රට තුළදී හා එතෙරදී යන දෙයාකාරයෙන්ම පුහුණු කිරීම් සිදු කෙරිණ.

බැංකුවේ, ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය මගින් අභ්‍යාස පාඨමාලා කිහිපයක් පවත්වන ලද බැවින්, මහ බැංකු නිලධාරීන් පුහුණුව සඳහා වෙනත් දේශීය අභ්‍යාස ආයතනයන් වෙත යැවීමේ අවශ්‍යතාවය බෙහෙවින් අඩු විය. නිලධාරීන් අනූ දෙනෙක් අභ්‍යාස විද්‍යාලයේ අභ්‍යාස පාඨමාලා හැදෑරූහ. අභ්‍යාස පාඨමාලා සහ සම්මන්ත්‍රණවලට නිලධාරීන් සහභාගී වූ වෙනත් ආයතන නම් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය හා ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයද වේ.

මෙම කාලය තුළදී මහ බැංකු නිලධාරීන් සඳහා ලංකා බැංකුවේ සහ මහජන බැංකුවේ වූ සේවාස්ථ පුහුණු පාඨමාලා නොකඩවා පැවැත්විණි. 1984 න් අවසන් වූ දොළොස් මස තුළදී මාණ්ඩලික හා මාණ්ඩලික නොවන ශ්‍රේණිවල නිලධාරීන් 33 දෙනෙක් මෙකී පුහුණුව ලැබූහ.

# කාර්ය මණ්ඩල පුවත්

1984 වර්ෂය තුළදී අධිපති ආචාර්ය ඩබ්ලිව්. රාසපුත්‍ර පහත සඳහන් සමුළු සහ රැස්වීම්වලට සහභාගි විය.

(අ) බුරුමයේ රන්ගුන් නුවර පවත්වන ලද අග්නිදිග ආසියානු (සියසන්) මහ බැංකු අධිපතිවරුන්ගේ 19 වැනි සම්මන්ත්‍රණය.

(ආ) පකිස්ථානයේ පවත්වන ලද ආසියානු නිෂ්කාශන සංගමයේ අධිපතිවරුන්ගේ 12 වැනි සභා වාරයේ රැස්වීම.

(ඇ) ඇමෙරිකා එක්සත් ජනපදයේ වොෂින්ටන්හි පවත්වන ලද 24 කණ්ඩායමේ රැස්වීම් හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අන්තර් කමිටු සහ සංවර්ධන කමිටු රැස්වීම.

(ඈ) ලන්ඩන් නුවර පවත්වන ලද පොදු රාජ්‍ය මණ්ඩලීය මහ බැංකු අධිපතිවරුන්ගේ සමුළුව සහ පොළී ප්‍රමාණයන් තාර්කික කර ගැනීම සඳහා ග්‍රීසියේ මහ බැංකුව (Bank of Greece) සමග ග්‍රීසියේ ඇතන්ස් නුවරදී පවත්වන ලද සාකච්ඡා.

(ඉ) ඇමෙරිකා එක්සත් ජනපදයේ වොෂින්ටන්හිදී පවත්වන ලද 24 කණ්ඩායමේ රැස්වීම් හා අන්තර් කමිටු රැස්වීම සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ හා ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුවේ (International Bank for Reconstruction and Development) වාර්ෂික රැස්වීම.

(ඊ) ආර්ජෙන්ටිනාවේ බුවෙනොස් අයර්ස්හි පවත්වන ලද 'ආර්ථික ඒකාබද්ධිකරන සහණය' සමුළුව.

1984 දෙසැම්බර් 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි එන්. ජේ. පී. පණ්ඩිතරත්න මහතා මුදල් මණ්ඩලයෙන් ඉල්ලා අස් විය.

1984 දෙසැම්බර් 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඩී. එස්. ජයසුන්දර මහතා මුදල් මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කරන ලදී.

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් නොපැමිණි කාලසීමාවන් තුළදී මුදල් මණ්ඩලයේ නිල සාමාජිකයාගේ විකල්ප නිලධාරියා ලෙස භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් සී. පී. චන්මුගම් මහතා කටයුතු කළේය.

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම්ද, භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ද නොපැමිණි අවස්ථාවක මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ වැඩ බලන ලේකම් ලෙස බී. මහාදේව මහතා මුදල් මණ්ඩලයේ රැස්වීමකට සහභාගි විය.

ජනවාරි, පෙබරවාරි, අප්‍රේල්, ජූනි, සැප්තැම්බර්, ඔක්තෝබර් සහ නොවැම්බර් යන මාසවල අධිපති දිවයිනෙන් බැහැරව සිටි කාලසීමා තුළදී ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති ඩී. එල්. කන්නන්ගර මහතා ප්‍රධාන විධායක නිලධාරියා සහ මුදල් මණ්ඩලයේ සභාපති වශයෙන් කටයුතු කළේය.

සැප්තැම්බර් මාසයේදී අධිපති හා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති යන දෙදෙනාම දිවයිනෙන් බැහැරව සිටි කාලසීමාව තුළදී නියෝජ්‍ය අධිපති ටී. ජී. පුංචිඅප්පුහාමි මහතා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති වශයෙන් නම් කරනු ලැබ, මහ බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා හා මුදල් මණ්ඩලයේ සභාපති වශයෙන් කටයුතු කළේය.

**පත්කිරීම්**

නියෝජ්‍ය අධිපති ඩී. එල්. කන්නන්ගර මහතා 1984 අගෝස්තු 2 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති වශයෙන් නම් කරන ලදී.

විධායක අධ්‍යක්ෂ ටී. ජී. පුංචිඅප්පුහාමි මහතා 1984 අගෝස්තු 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නියෝජ්‍ය අධිපතිවරයෙකු වශයෙන් පත් කරන ලදී.

බැංකු සංවර්ධන හා පුහුණු කිරීම් උපදේශක එස්. ඩබ්ලිව්. පී. අමරසූරිය මහතා 1984 මාර්තු 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මාණ්ඩලික පංතියේ විශේෂ ශ්‍රේණියට උසස් කරන ලද අතර, විධායක අධ්‍යක්ෂවරයෙකු වශයෙන් නම් කරන ලදී.

ප්‍රධාන ගණකාධිකාරී යූ. ඒ. ද සිල්වා මහතා 1984 නොවැම්බර් 6 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මාණ්ඩලික පංතියේ විශේෂ ශ්‍රේණියට උසස් කරන ලදී. 1984 නොවැම්බර් 9 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔහු විධායක අධ්‍යක්ෂවරයෙකු වශයෙන් පත් කරන ලදී.

මහජන බැංකුවේ සභාපති වශයෙන් කටයුතු කිරීමට මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයට මුදා හැර ඇති ආචාර්ය එස්. ටී. ජී. ප්‍රනාන්දු 1984 නොවැම්බර් 6 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මාණ්ඩලික පංතියේ විශේෂ ශ්‍රේණියට උසස් කරන ලදී.

1984 මාර්තු 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ආර්. එම්. තෙන්නකෝන් මහතා බැංකු සංවර්ධන හා පුහුණු කිරීම් උපදේශක වශයෙන් පත් කරන ලදී. බැංකු සංවර්ධන හා පුහුණු කිරීම් උපදේශක තනතුරේ කටයුතුවලට අමතරව ඔහු 1984 සැප්තැම්බර් 5 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි බැංකු පරිපාලන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී. 1984 නොවැම්බර් 6 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔහු මාණ්ඩලික පංතියේ විශේෂ ශ්‍රේණියට උසස් කරන ලද අතර, 1984 නොවැම්බර් 9 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ අධිකාරී වශයෙන් පත් කරන ලදී.

සොලමන් දූපත්හි මූල්‍ය අධිකාරියේ තනතුරක් සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත මුදාහරිනු ලැබ සිටි එන්. ඒ. ධර්මබන්දු මහතා 1984 මාර්තු 26 වැනි දින සිට නැවත බැංකු සේවාවට පැමිණි අතර, වැඩ බලන අතිරේක ප්‍රධාන ගණකාධිකාරී වශයෙන් පත් කරන ලදී. 1984 නොවැම්බර් 9 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔහු ප්‍රධාන ගණකාධිකාරී වශයෙන් පත් කරන ලදී.

පරිශ්‍ර අධ්‍යක්ෂ පී. එම්. නාගහවත්ත මහතා 1984 ජනවාරි 13 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔහුගේ පරිශ්‍ර අධ්‍යක්ෂ තනතුරේ කටයුතුවලට අමතරව අතිරේක ප්‍රධාන ගණකාධිකාරී වශයෙන් පත් කරන ලදී.

අතිරේක විනිමය පාලක ඩී. ඒ. පී. වීරවර්ධන මහතා 1984 මැයි 2 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි විනිමය පාලක වශයෙන් පත් කරන ලදී.

ග්‍රාමීය බැංකු සහ මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලයේ අධ්‍යක්ෂ ආචාර්ය ජී. එම්. අබයරත්න 1984 මැයි 2 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට මුදාහැර සිටි ආචාර්ය එම්. යූ. ඒ. තෙන්නකෝන් 1984 පෙබරවාරි 23 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත බැංකු සේවාවට පැමිණියේය. ඔහු මාණ්ඩලික පංතියේ IV වැනි ශ්‍රේණියට උසස් කරන ලදුව 1984 මාර්තු 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ග්‍රාමීය බැංකු සහ මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලයේ වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ වශයෙන් පත්කරන ලදී. 1984 මැයි 2 වැනි දින සිට ඔහු ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලයේ වැඩ බලන අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

ආචාර්ය එන්. ඊ. එච්. සඳරත්න මාණ්ඩලික පංතියේ IV වැනි ශ්‍රේණියට උසස් කරන ලද අතර, 1984 මාර්තු 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩ බලන සංඛ්‍යාන අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

භූතානයේ රාජකීය මූල්‍ය අධිකාරියේ තනතුරක් සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට මුදාහැර සිටි ආචාර්ය ඩබ්ලිව්. හෙට්ටිආරච්චි 1984 අගෝස්තු 22 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත බැංකු සේවාවට පැමිණියේය. ඔහු මාණ්ඩලික පන්තියේ IV වැනි ශ්‍රේණියට උසස් කරන ලද අතර, 1984 නොවැම්බර් 9 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි බැංකු සංවර්ධන හා පුහුණු කිරීමේ වැඩ බලන උපදේශක වශයෙන් පත් කරන ලදී.

සියරා ලියොන් මහ බැංකුවේ තනතුරක් සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට මුදාහැර සිටි ඊ. බාලසිංහම් මහතා 1984 සැප්තැම්බර් 17 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත බැංකු සේවාවට පැමිණියේය. ඔහු මාණ්ඩලික පංතියේ IV වැනි ශ්‍රේණියට උසස් කරන ලද අතර, 1984 නොවැම්බර් මස 9 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි බැංකු පරිපාලන දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂවරයා වශයෙන් පත් කරන ලදී.

**විශ්‍රාම ගැනීම්**

විධායක අධ්‍යක්ෂ වී. එස්. සුබ්‍රමනියම් මහතා 1984 ජූනි 24 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි බැංකු සේවාවෙන් විශ්‍රාම ගත්තේය.

බැංකු පරිපාලන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ එස්. පොන්නයියා මහතා 1984 සැප්තැම්බර් 7 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි බැංකු සේවාවෙන් විශ්‍රාම ගත්තේය.

**අභාවයන්**

ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධිකාරී සී. ඩී. විමලසූරිය මහතා 1984 අගෝස්තු 15 වැනි දින අභාවප්‍රාප්ත විය.

**මුදාහරිනු ලැබ සිටි නිලධාරීහු (1984 දෙසැම්බර් 31 වැනි දිනට)**

පහත නම් සඳහන් බැංකු නිලධාරීහු පහත දක්වෙන අමාත්‍යාංශවලට, රජයේ දෙපාර්තමේන්තුවලට හා ශ්‍රී ලංකාවේ රාජ්‍ය සංස්ථාවලට සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ තනතුරු සඳහා ද මුදාහරිනු ලැබ සිටියහ.

විධායක අධ්‍යක්ෂ ඒ. එස්. ජයවර්ධන මහතා බංගලා දේශය, භූතානය, ඉන්දියාව හා ශ්‍රී ලංකා යන රටවල විකල්ප විධායක අධ්‍යක්ෂ වශයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත.

ආචාර්ය එස්. ටී. ජී. ප්‍රනාන්දු, මහජන බැංකුවේ සභාපති වශයෙන් කටයුතු කරනු සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.

එස්. රාජලිංගම් මහතා මහා භාණ්ඩාගාරයේ ආර්ථික කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කරනු සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.

එස්. ඊස්පරදාසන් මහතා විදේශීය සම්පත් දෙපාර්තමේන්තුවේ විදේශ ණය පාලන හා පරිපාලන ඒකකයේ අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කරනු සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.

ආචාර්ය එල්. ඊ. එන්. ප්‍රනාන්දු ලංකා බැංකුවේ සභාපති වශයෙන් කටයුතු කරනු සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.

ඒ. ඒ. ඩී. ජස්ටින් මහතා කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් කටයුතු කිරීම සඳහා කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශය වෙත.

ආචාර්ය ඒ. සී. රන්දෙනි, ආචාර්ය ජී. අබේසේකර, ආචාර්ය අයි. කුමාරස්වාමි සහ එම්. බී. දිසානායක, ජී. ඒ. වී. පොන්සේකා සහ ඊ. ඒ. පී. එන්. ඩයස් යන මහතුන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.